# 2013 – 07 – 02 වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පැවති මාසික සභා රැස්වීම් වාර්තාව

සහභාගීත්වය :-

| | | |
|---|---|---|
| **01.** | එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා | ගරු සභාපති |
| 02. | කමල් වැල්ලගේ මහතා | ගරු උප සභාපති |
| **03.** | ඒ. පී. ලක්ෂ්මි හේමන්තා සිල්වා මෙනවිය | ගරු නගර සභා මන්ත්‍රී |
| **04.** | එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **05.** | එච්. එල්. අනුර කිත්සිරි මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| 06. | පී. සරත් ශ්‍රීලාල් මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **07.** | ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **08.** | ඒ. ඩබ්. ජගත් කුමාර මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **09.** | ජේ. ඩබ්. ජයන්ත මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **10.** | ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **11.** | කේ. එම්. චන්ද්‍රසිරි මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **12.** | බී. ජනිත් වික්‍රමතිලක මහතා | ගරු නගර සභා මන්ත්‍රී |

☸ **පන්සිල් සමාදන් වීමෙන් අනතුරුව පෙ. ව. 09.30 ට රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.** ☸

**(01)**

**01:01** **2013 – 06 – 04 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම**

2013 – 06 – 04 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.

✠ **ඒ අනුව 2013 - 06 – 04 දින පවත්වන ලද මාසික සභා වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**(02)** **සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන** නැත

**(03)** **ලැබී ඇති පැමිණිලි පෙත්සම් හා ලිපි සභාවට ඉදිරිපත් කිරීම**

**3:1** " බංගලාදේශ රාජ්‍ය නිලධාරී කණ්ඩායම - අධ්‍යයන චාරිකාව - 2013.06.03 - 09 " මැයෙන් 2013- 06- 13 දාතමින් පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ අතිරේක ලේකම් විසින් එවන ලද ලිපිය සභාගත කරන ලදී.

පළාත් පාලනය පිළිබඳව අධ්‍යයන චාරිකාවකට පැමිණි නිලධාරී කණ්ඩායම වෙනුවෙන් නගර සභාව විසින් සැලසුම් කර තිබූ පිළිගැනීම් කටයුතු , සංග්‍රහ කටයුතු සහ පැමිණි පිරිස දැනුවත් කිරීම් කටයුතු ඉතා උසස් අන්දමක් තිබූ බවත් ඒ සඳහා ස්තූතිය පුද කරන බවත් දන්වා තිබුණි.

<u>තීරණය</u>

☞ **මෙම ලිපිය සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

3.2 " අය වැය යෝජනා - 2013 " මැයෙන් 2013- 06- 04 දාතමින් දකුණු පළාත් පළාත් පාලන කොමසාරිස්තුමා විසින් එවන ලද ලිපිය සභාගත කිරීම.

අතිගරු ජනාධිපතිතුමා විසින් 2013 අයවැය යෝජනා ඉදිරිපත් කරමින් ශක්තිමත් ආදායම් හැකියාවක් ඇති මහ නගර සභා සහ නගර සභා වලට නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ ආනයනය සඳහා අදාල තීරු බද්දෙන් හා එකතුකල අගය මත බද්දෙන් නිදහස් කිරීමට ඇති යෝජනාව අනුව පළාත් පාලන ආයතන තම අවශ්‍යතා හඳුනාගෙන අදාල බදු සහනය ලබා ගැනීමට කටයුතු කරන ලෙසත් දන්වා තිබුණි.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

සමස්ථ පළාත් පාලන සියල්ල වෙනුවෙන්ම මේ සඳහා ස්තූතිය පුද කරන්න ඕනෙ. පළාත් පාලන ක්ෂේත්‍රය ප්‍රායෝගික තත්වයට පත් කිරීම සඳහා අතිගරු ජනාධිපතිතුමා විසින් 2013 අයවැය යෝජනා යටතේ ඉදිරිපත් කරන ලද මෙම යෝජනාව සම්බන්ධව.

මේ සම්බන්ධයෙන් විශේෂ ස්තූතියක් පුද කර යැවීමට සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි පළාත් පාලන ආයතන කියන්නෙ ජනතාවට උපතේ සිට මරණය දක්වාම සේවාවන් සපයන ආයතනයක්. අද පවතින තත්වය තුල ඕනම පළාත් පාලන ආයතනයකට කර්මාන්ත අංශය පැත්තෙන් බැලුවම සෑහෙන වැඩ කොටසක් කෙරෙනව. මෙහිදී බැකෝ යන්ත්‍ර , මාර්ග තලන යන්ත්‍ර ආදිය ලබා ගැනීම ඉතා වැදගත්. අම්බලන්ගොඩ

නගර සභාවටත් බැකෝ යන්ත්‍රයක් අවශ්‍යයි. නමුත් අපිට ලබා ගැනීමට හැකියාවක් නැහැ. මේ බව තේරුම් අරගෙන අතිගරු ජනාධිපතිතුමා තීරුබදු රහිතව ආනයනය කරන්න ගෙනා යෝජනාව සම්බන්ධයෙන් අපේ ස්තුතිය පුද කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි මේ සම්බන්ධයෙන් අපේ රටේ රාජ්‍ය නායකයා වන අතිගරු ජනාධිපතිතුමාට ස්තුතිය පුද කරනවා. ගමේ සහ රටේ සංවර්ධනය කෙබඳුද යන්න වටහාගත් නායකයකු ලෙස මෙතුමා නිරන්තරවම ප්‍රාදේශීය දේශපාලඥයන් සමග සිටිමින් කටයුතු කරන රාජ්‍ය නායකයෙක්. මෙතෙක් වරප්‍රසාද ලත් කොටසකට පමණයි තීරුබදු රහිත නිර්නායකය යටතේ වාහන ගෙන්වීම ගැන අපට අහන්න ලැබෙන්නේ. එවන් වටපිටාවක් තුලදී මෙය රටේ සමස්ථ මහජනතාවටම ප්‍රතිලාභ ලැබීමක් ලෙසයි මා දකින්නේ. අපේ ගමේ ඉන්න ප්‍රදේශවාසීන්ට සමස්ථ රටවැසියන්ටම මෙහි ප්‍රතිඵල ලැබෙනව සභාපතිතුමනි. ආසියාවේ ආශ්චර්ය කරා යන ගමනේදි එය දිනෙන් දිනම පෙන්නුම් කෙරෙන මොහොතක සංවර්ධනයේ අරුණලු පෙනෙන මොහොතක එහි සැබෑ ප්‍රතිඵල ලබා ගැනීමේ පරමාර්ථය මුලික කොට ගෙන ගරු ජනාධිපතිතුමා ගත්ත මේ තීරණය අපි නැවත නැවතත් අගය කරන්න ඕනෙ. ඒවගේම මේ ලැබුන අවස්ථාවෙන් උපරිම ප්‍රයෝජන ලබා ගන්න කියල මම ඉල්ලා සිටිනවා. විශේෂයෙන්ම බැකෝ යන්ත්‍රයක්, විදුලි උත්පාදන යන්ත්‍රයක්, නව තාක්ෂණ උපකරණ රට අමතරව පාරවල් කාපට් කරන යන්ත්‍ර පවා මිලදී ගැනීමේ හැකියාව තියෙනවා. මේ සම්බන්ධයෙන් නැවතත් අතිගරු ජනාධිපතිතුමාට ස්තුතිය පුද කරමින් මම නිහඬ වෙනවා.

<u>තීරණය</u>

☞ **මෙම ලිපිය සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී .**

3.3 “ මෝදර දේවාලයේ ඇසළ මහා පෙරහර සඳහා කැට මගින් ආධාර එකතු කිරීම ” මැයෙන් අම්බලන්ගොඩ, මෝදර දේවාලයේ සමලේකම් විසින් එවා තිබූ ලිපිය සභාගත කිරීම.

අම්බලන්ගොඩ මෝදර දේවාලයේ 69 වන වාර්ෂික ඇසළ මහා පෙරහැර සහ උත්සවය සහ සැප්තැම්බර් මස 19 දින හා 20, 21 දිනවල පැවැත්වෙන බවත් කැට කරුවන් අම්බලන්ගොඩ බස් නැවතුම්පොල තුල හා නගර සභා බල ප්‍රදේශය තුල ආධාර එකතු කිරීමටත් ඒ දිනවල වෙනත් කැට කරුවන්ට බස් නැවතුම්පොල ආධාර එකතු කිරීම සඳහා වෙනත් කැට කරුවන්ට ලබා නොදෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **මෝදර දේවාලයේ 69 වන වාර්ෂික ඇසළ මහා පෙරහැර සහ උත්සවය වෙනුවෙන් අම්බලන්ගොඩ බස් නැවතුම්පොල තුල සැප්තැම්බර් මස 19, 20, 21 දිනවල කැට කරුවන්ට මගින් ආධාර එකතු කිරීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී .**

**(04)** යථා පරිදි කල්දී ඇති ප්‍රශ්ණ **නැත**

**(05)** යථා පරිදි කල්දී ඇති යෝජනා

## 5:1 ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන යෝජනා

**5:1:1** ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව

**අම්බලන්ගොඩ නගරයේ පළමු වසර සඳහා ළමුන් ඇතුලත් කිරීඹ සම්බන්ධයෙන් ප්‍රශ්න ගැටලු රාශියක් 2012/19 චක්‍රලේඛය අනුව මතුව ඇත. එබැවින් අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශය තුල ජීවත් වන වරිපනම් ගෙවන ජනතාවගේ දරුවන්ට ජනප්‍රිය ජාතික පාසලක් වන ගා/ ධර්මාශෝක මහා විද්‍යාලයට හා ගා/ දේවානන්ද මහා විද්‍යාලයට ඇතුලත්වීමේ ඉඩකඩ ඇහිරී ඇත.**

**මෙයට සාධාරණ විසඳුමක් ලෙස ලකුණු කැපීමේ ක්‍රමවේදයේ ජාතික පාසලකට අයදුම් කිරීමේදී තවත් ජාතික පාසලක් ආසන්නයේ පිහිටා ඇත්නම් පමණක් ලකුණු අඩු කිරීම සාධාරණ වන අතර එම ආසන්නයේ පිහිටි පළාත් සභා පාසල් සඳහා ලකුණු අඩු කිරීම නොකරන ලෙස අධ්‍යාපන අමාත්‍යාංශය වෙත මෙම නගර සභාව යෝජනා කර සිටින්නීය.**

**ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි අම්බලන්ගොඩ නගරය ග්‍රාමසේවා කොට්ඨාශ 13 කින් සමන්විත වෙනවා. නගරයේ කොට්ඨාශ කිපයකම පළාත් සභා පාසල් කිහිපයක්ම පිහිටා තිබෙනවා. ජාතික පාසල් දෙක පිහිටා තිබෙන්නේ නගරය ආශ්‍රිතවයි. විශේෂයෙන්ම ගත්තොත් ධර්මාශෝක විද්‍යාලයට කිලෝමීටරයක් ඇතුලත ඉන්න ළමයිනුත් නොතේරෙන අවධියකයි තියෙන්නෙ. මේක වෙලා තියෙන්නෙ මෙම 2012/19 චක්‍රලේඛනයේ වරදකින්. ඒ නිසා මා ඉල්ලා සිටිනවා ජාතික පාසලකට අයදුම්කරහම තවත් ජාතික පාසලක් ආසන්නයේ තියෙනව නම් ලකුණු කපන එක සාධාරණයි. පළාත් සභා පාසල් වලටත් ලකුණු කැපීමෙන් අපේ නගරයේ වරිපනම් ගෙවන ස්ථිර පදිංචි කරුවන්ට ලොකු අසාධාරණයක් වෙනවා. මේක දරුවන්ගේ මානුෂික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක්. දෙමාපියන්ගේ එකම අරමුණ ජනප්‍රිය පාසලකට දරුවන් යැවීම. පාසල පෙනි පෙනි ජාතික පාසලක් අහිමි වෙනව කියන්නෙ ළමයින්ගෙ ඕනව අයිතීන් උල්ලංඝනය වීමක්. ඒ නිසා මේක අපි අමාත්‍යාංශයට ගිහිල්ල කතා කරල හරි වෙනස් කල යුතුයි. දේශපාලනය කරන අපට වගේම අධ්‍යාපන බලධාරීන්ට පවා මේක ගැටලුවක්. ඒ අයත් චක්‍රලේඛනය තුල හිරවෙලා ඉන්නවා. ඒ නිසා අපි අදාල අංශ එක්ක සාකච්ඡා කරල 2012/19 චක්‍රලේඛනයේ අවශ්‍ය තැන් සංශෝධනයන් කිරීමට අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේත් සහාය ඇතිව හැකි ඉක්මනින් මෙය ක්‍රියාවට නැංවීමට ඔබතුමාගේත් ගරු මන්ත්‍රීවරුන්ගේත් සහයෝගය ලබා දෙන ලෙසත් ඉල්ලා සිටිමින් නිහඩ වෙනවා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි මෙය නගරයේ බදු ගෙවන ජනතාවට වන බලවත් අසාධාරණයක් ලෙසයි මා දකින්නෙ. ළමයින් 1 වන වසරට ඇතුලත් කිරීමේදී සිදුවන මේ ගැටලුව සම්බන්ධව මේ වන විට විසඳුමක් ලැබිල නැහැ. අපි දිගින් දිගටම මේ ගැන කතා කරල තියෙනවා. අම්බලන්ගොඩ නගරයේ බදු ගෙවන ජනතාවට වන අසාධාරණය අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන්ට පේන්නෙ නැහැ. ඒ නිලධාරීන් කොළඹ ඉඳගෙන චක්‍රලේඛ නිකුත් කරාට අපි ගමේ ඉන්න දේශපාලනඥයින් වශයෙන් අපට තමයි මුලටම මේ ප්‍රශ්නය එන්නෙ. කොළඹ තියෙන පාසල් වලට හදපු මේ චක්‍රලේඛනය අම්බලන්ගොඩ නගරයට නොගැලපීම තමයි මේකට හේතුව වෙන්නෙ. අද ධර්මාශෝක විද්‍යාලය ගත්තහම බලපිටිය සහ රත්ගම කියන ආසන දෙකේ ළමයින්ට ඇතුල් වීමට තියෙන ඉඩකඩ වැඩියි. රත්ගම පැත්තට ගත්තම කිලෝ මීටර් දෙකක් විතර යනතුරු පාසලක් නැහැ. බලපිටිය පැත්තට කිලෝ මීටර් එක හමාරක් විතර යනකම්ම පාසලක් නැහැ. ඒ නිසා මේ නගරය ඇතුලෙ තියෙන පාසැල් හතරකට ලකුණු කැපීම නිසා තමයි සභාපතිතුමනි මේ නගරයේ ඉන්න ළමයි ධර්මාශෝක විද්‍යාලයට සහ දේවානන්ද විද්‍යාලයට තේරෙන්නෙ නැත්තෙ. අපේ මන්ත්‍රීතුමා ගෙනා යෝජනාව අනුව ජාතික පාසලකට ඇතුලත් කිරීමේදී තවත් ජාතික පාසලකට පමණක් ලකුණු අඩු කිරීමේ ක්‍රමය ක්‍රියාත්මක කරොත් මම හිතන්නෙ අම්බලන්ගොඩ දරුවන්ට කරන සාධාරණයක් හැටියටයි අපි දකින්නෙ. අපි සියලුම දෙනා පක්ෂ භේදයකින් මේ යෝජනාවට එකගයි. 2014

වර්ෂයේදීවත් මේ දෙමව්පියන්ට ධර්මාශෝක සහ දේවානන්ද විද්‍යාල වලට ළමුන් ඇතුලත් කිරීම සිදු කිරීමට මේ සඳහා අපි මැදිහත් වෙමු කියන ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි මේ යෝජනාව අපි දිගින් දිගටම කතා කරන මාතෘකාවක්. පහුගිය සම්බන්ධීකරණ රැස්වීමේදීත් මේ සම්බන්ධව සාකච්ඡා වුනා. නමුත් තාම මෙයට විසඳුමක් ලැබිල නැහැ. කණගාටුවට කරුණ සභාපතිතුමනි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලවල සිටින අයත් අවසාන මොහොතේදීත් අත්තනෝමතික විදියට බොහොම නිර්ලජ්ජිත ආකාරයෙන් කටයුතු කරමින් ගමේ ළමුන් කප්පාදු කරන්න කටයුතු කරනවා. එතනදී දෙපව්පියන් සදා අසරණ තත්වයකට පත් වෙනවා. මහ අම්බලන්ගොඩ ප්‍රදේශවාසීන්ට මාර්ගයෙන් ගමන් දුර මීටර් හතක් විතර තියෙන ජල දුර්ගයක් හරහා තියෙන අඩුම ගානේ ඔරුවක් වත් නැති මාදම්පා ගඟෙන් එහා තියෙන ඉඩම්තොට ප්‍රාථමික විද්‍යාලයට ලකුණු පහ කැපීම ඉතාම කණගාටුදායකයි. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලවල ඉන්නෙ උගත් පිරිසක්. අපි පසුගිය දිනක දේවානන්ද විද්‍යාලයේ විදුහල්පතිතුමා මුණ ගැහෙන්න ගියා. එහිදී අපි සුහදව කතා බව කරා. නමුත් ඊට දින කීපයකට පසුව සභාවට නිර්නාමික ලිපියක් එවල තිබුණා. අපි කණගාටුවෙනවා එවන් නිර්ලජ්ජිත පිරිසක් එතුමාගේ වටපිටාවේ සිටීම සම්බන්ධව. අපේ ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු යෝජනාවට අදාලව මම අවස්ථාවක් කර ගන්නව මේක නිසි බලධරයන්ගේ අවධානයට යොමු කිරීමටත්. එදා අපිට දේවානන්ද විද්‍යාලයේ විදුහල්පතිතුමා දැනුම් දුන්නා ලකුණු 85 ට වැඩි අසාධාරණ වුන අය ඉන්නව නම් දැනුම් දෙන්න කියලා. මහ අම්බලන්ගොඩ ප්‍රදේශයේ ලකුණු ඉන්නව ලකුණු 88, 85 තියෙන ළමයි. නමුත් අවසානයේදී කිව්ව පුරප්පාඩු නැහැයි කියලා. මේ සම්බන්ධයෙන් විමසීම් කිරීමට ගරු අධ්‍යාපන ඇමතිතුමා දුරකථනයෙන් උත්සාහ කලා. නමුත් එතුමා දුරකතනයට යොමු වුනේ නැහැ. ඒ වගේම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් උත්සාහ කරා. එයත් නිශ්ඵල වුනා. බලපෑමක් කරන්න නෙමෙයි. විමසීමක් කරන්නයි උත්සාහ කරේ. අපි ගිහිල්ල සාකච්ඡා කරන අවස්ථාවලදී සභාපතිතුමනි ළමයි 18- 22 අතර ප්‍රමාණයක් තමයි සියලු පන්ති වලට ඇතුලත් කරගෙන හිටයේ. දැන් 40 සීමාව කිට්ටුවට ඇවිල්ල තියෙනවා අර කියපු කිසිම නිර්ණායකයක් නෑ. ආසන්නතාව, සහෝදර අනුග්‍රහය, ආදි ශිෂ්‍යභාවය මේ කිසිවක් ගැන කිසිම සැලකිල්ලක් කරන්නෙ නෑ. මේවගේ ක්ස්ම විනිවිද තත්වයක් නැහැ. මම මේ සමගම අම්බලන්ගොඩ කෙරමිණිය ප්‍රදේශයේ කේ. ඒ. පී. සම්පත් මහතා ඉදිරිපත් කරන ලද ලිපියේ හයවන කරුණ සභාගත කරනවා. අම්බලන්ගොඩ නගරාධිපතිතුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලය සමග කල සාකච්ඡාව පරිදි ලකුණු 84 ට වැඩි ළමුන්ගේ නාම ලේඛනය ලබා දෙන ලෙසත් ඊට ටික වෙලාවකට පසු ලකුණු 85 ට වැඩි ළමුන්ගේ නාම ලේඛනය ලබා දෙන ලෙසත් පැවසු බවත් ඒ ආකාරයට ගරු විදුහල්පතිතුමා ප්‍රකාශ කලත් දිගින් දිගටම දෙමාපියන් ඉච්ඡා බංගත්වයට පත් වූ බවත් පවසා සවිස්තර වාර්තාවක් තියෙනවා. මේ සම්බන්ධවත් පැහැදිලි පියවරක් ගන්න කියල මා ඉල්ලා සිටිනවා. අපේ ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කල යෝජනාව අනුව ජාතික පාසල්වලට ළමුන් ඇතුලත් කර ගැනීමේදී පළාත් සභා පාසල් වලට ලකුණු කැපීම සිදු නොකිරීමට ක්‍රමවේදයක් අනුගමනය කරන්න කියා ඉල්ලා සිටිනවා සභාපතිතුමනි. ඒත් එක්කම මගේ අදහසක් තියෙනවා මේකට මට ජනතාවගෙන් දෝෂාරෝපණත් ඒවි. පළමු වසර සිට වසරවල් කීපයකට මේ පාසල් වල අත් හිටවනව නම් මේ වටපිටාවේ තියෙන සියලු පාසල් බලාගෙන ඉදිද්දි ඉහල මට්ටමකට ඒවි. එහිදී මේ සිදුවන අකටයුතුකම් 90% කට වැඩි ප්‍රමාණයක් අඩු වෙනවා. නැත්නම් සෑම වර්ෂයකම යම් කොටසකට අකටයුතුකම් සිදු වෙනවා. ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවට දැවැන්ත පක්ෂපාතිත්වය දක්වමින් නිහඬවෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්ෂමී හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි පළවෙනි වසරට ළමයි ඇතුලත් කිරීමේදී අපේ ගමේ ළමයින්ට ප්‍රමුඛතාවක් ලැබෙන විදියට කටයුතු කරන්න තමයි අපි හඩක් නගන්න ඕනෙ. පහුගිය දිනක මම ලගට ආව ඒ අය උපන් දා ඉඳලම පටබැඳිමුල්ලෙ පදිංචි අය. ඒ අයට ඡන්දය තියෙනවා ඔප්පුවක් නැහැ. මම ඒ අයට ඔප්පුවක් හදල දුන්නා. ගමේ ළමයෙක්ට කරන උදව්වක් විදියට. ගිය අවුරුද්දෙ හල්වතුරෙ ප්‍රජාපති විද්‍යාලයේ මායිමේ ඉන්න ළමයෙක් සම්මුඛ පරීක්ෂණයට දිනය ඇවිල්ල තිබුනෙ 31 වෙනිද කියල. නමුත් සම්මුඛ පරීක්ෂණය තිබුනෙ 03 වෙනිද. 31 වෙනිද සම්මුඛ පරීක්ෂණයට ගියහම සම්මුඛ පරීක්ෂණය ඉවරයි කියල. ඒ අම්ම අසරණ වෙලා මට කිව්වහම මම අධ්‍යක්ෂතුමියට කතාකරල කිව්ව මේ ළමයට සම්මුඛ පරීක්ෂණයට

කැඳවන්න කියල. ඊට පස්සෙ අභියාචනයක් ලියල දෙන්න කිව්ව. ඊට පස්සෙ සම්මුඛ පරීක්ෂණයෙදි ලකුණු 93 ක් තිබුණා. අප්‍රේල් මැයි වගේ කාලෙදි තමයි ඒ ළමය පාසලට දැම්මෙ. අපේ ගමේ දරුවන්ට පාසලට යන්න බැරි වුනාට මෙතන තියෙන වාහන දැක්කම පේනව වැඩිපුර ඉන්නෙ පිට ළමයි. අපේ ගමේ පාසලේ දොර ඇරිය යුත්තෙ අපේ ගමේ ළමයින්ට. රාහුල මන්ත්‍රීතුමනි ඔබතුමාගෙ යෝජනාව වෙනුවෙන් ඕනම වෙලාවක හඬක් නගන්න මම ඉන්නව. අපේ විපක්ෂනායකතුමා ඇතුලු විපක්ෂයේ සියලු මන්ත්‍රීවරුත් අපි පාලක පක්ෂයේ සියලු මන්ත්‍රීවරුත් එකතු වෙලා මේකට හඬක් නගමුයි කියා ඉල්ලමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි රාහුල මන්ත්‍රීතුමා ගෙනා යෝජනාව වැදගත් යෝජනාවක්. මේ යෝජනව සම්බන්ධව කතා කිරිමේදී අපි අම්බලන්ගොඩ වැසියන් විදියට ඉතාම කණගාටුවට පත් වෙනවා. ධර්මාශෝක, දේවානන්ද, කුලරත්න, ප්‍රජාපතී කියන විද්‍යාල හතරෙම අපිට ඕන විදියට වැඩ කෙරෙන්නෙ නෑ. ඒවගෙ ඉන්න ක්‍රියාකාරී අයට ඕන විදියට තමයි වැඩ කෙරෙන්නෙ. මහ අම්බලන්ගොඩ තාම ඉන්නව ඉස්කෝලයක් නැති ළමයි. දේගොඩ ඉන්නව ලකුණු 84 ක ළමයෙක් තාම පාසල් නැතුව. කෙරෙන්න ඕන ළමයට කොහොමහරි වැඩේ කෙරෙනව. අසරණ, අහිංසක, දුප්පත් ළමයට. සල්ලි තියෙනව නම් ඕන දෙයක් කර ගන්න පුලුවන්. මෙතනදි ලොකු අසාධාරණයක් වෙනව පෝරඹ, පොල්වත්ත, කෙරමිණිය ප්‍රදේශ වගේම මහ අම්බලන්ගොඩ ප්‍රදේශයේ දරුවන්ටත් අවාසියක් වෙනවා. අපි මේ යෝජනාව මෙතන කතා කරල හරියන්නෙ නෑ. අපේ නගරෙ දරුවන්ට තියෙන දුක් ගැනවිල්ල කියල සිදුවෙන අසාධාරණය කියල අධ්‍යාපන අමාත්‍යතුමාට දන්වන්න ඕනෙ. ඒ නිසා මම නගරයේ මන්ත්‍රීවරයෙක් විදියට මෙය ක්‍රියාත්මක කරන්න කටයුතු කරන්න කියල ඉල්ලා සිටිනවා. අපේ සහයෝගයත් මේ සඳහා අපි ලබා දෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි සහෝදර මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මන්ත්‍රීතුමා ගෙන එන ලද යෝජනාව සම්බන්ධයෙන් ගත්තහම මේ ප්‍රශ්නෙදි නගර වැසියන්ට කෙලින්ම සම්බන්ධ වෙන්නෙ මහජන නියෝජිතයන්. මම අපේ හිටපු මන්ත්‍රී කුලරත්න විද්‍යාලයේ විදුහල්පති ජගත් සේනාරත්න මහතාත් එක්ක කතා කරල මේ යෝජනාවම මම ගෙනාව. එදත් මේ විදියටම අපි කතා කරා. එදා පළවෙනි යෝජනාව විදියට ගෙනාවෙ පළාත් සභා පාසල් වර්ගීකරණයක් කරල ලකුණු කපන්නයි කියල. දෙවනි යෝජනාව තමයි මේ අද රාහුල මන්ත්‍රීතුමා ගෙනා යෝජනාව. එම යෝජනා ඉදිරිපත් කරත් අධ්‍යාපන අමාත්‍යාංශයට ඒව හමස් පෙට්ටියට තමයි ගියේ. මේකෙදි නගරවාසීන්ට තමයි මේ අසාධාරණය වැඩිපුරම වෙන්නෙ. විශේෂයෙන්ම පොල්වත්ත, කෙරමිණිය, කලුවඩුමුල්ල, තල්ගස්ගොඩ ඒවගේම මහ අම්බලන්ගොඩ, විලේගොඩ ප්‍රදේශ වල අයට. අම්බලන්ගොඩ නගර පිහිටල තියෙන්නෙ ධර්මාශෝක දේවානන්ද විද්‍යාල වලින් ඇතුලට වෙන්න. මේ ප්‍රශ්නය අපි අවුරුදු පතා කතා කරත් නිසි පිළිතුරක් ලැබිල නැහැ. මේව මෙහෙම විය යුතු නැහැ. පාර්ලිමේන්තුව, පළාත් සභාව, නගර සභාව මේ තුනම එකම පක්ෂයක තිබෙන නිසා අපිට විශ්වාසයක් තියෙනව මේ කටයුත්ත කරන්න පුලුවන් කියලා. මේ යෝජනාව මෙතනින් පස්සෙවත් මේ සභාවට නැවිත් මෙය ක්‍රියාත්මක කර ගන්නට ශක්තිය ධෛර්ය තමුන්නාන්සේලාගේ දේශපාලන අධිකාරියට ලැබේවායි කියල පතමින් මම නිහඩ වෙනවා. අපේ සහයෝගයත් ලබා දෙන බව පවසමින්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මන්ත්‍රීවරුනි, නිලධාරීවරුනි, මධ්‍යවේදී මහතුනි, අපේ රාහුල ලලිතවික්‍රම මන්ත්‍රීතුමා ගෙනා යෝජනාව සම්බන්ධයෙන් මා දකින්නෙ පළමුව අපි කොටස් දෙකක් හඳුනගත යුතුව තිබෙනවා. රාහුල මන්ත්‍රීතුමාගේ යෝජනාවේ තිබෙන්නේ චක්‍රලේඛනය අනුව අපට මේ ප්‍රශ්නෙට විසඳුමක් සොයාගන්න පුලුවන්ද කියන එක. අපි ඉතිහාසය පුරාවටම මේ ගරු සභාවේ වාද විවාද කරල තියෙන්නෙ සමහර වෙලාවට මේ චක්‍රලේඛනය අනුව පාසල් කටයුතු කරන ආකාරය පිළිබඳව. මේක කොටස් දෙකක්. මේ චක්‍රලේඛනයට අනුව පාසල් කටයුතු කරන ආකාරය පසෙකින් තියල රාහුල මන්ත්‍රීතුමා අදහස් කරපු දේ ගැන අපි කතා කරොත් ඇත්තටම සභාපතිතුමනි මේක අපේ මට්ටමෙන් විසඳන්න තියෙන ඉඩකඩ බොහොම අඩුයි. එදා ක්‍රීඩා ආයතනයේ මහ ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති රැස්වීමේදී අනුමත වෙලත් මේ

යෝජනාව මේ අමාත්‍යාංශෙට ගිහිල්ලත් මේ චක්‍රලේඛනයේ කිසිදු ඉස්පිල්ලක් පාපිල්ලක් වෙනස් නොවී පවතිනවා. එතරම් බලගතු ආයතනයක් කරන යෝජනාවක් සැලකිල්ලට භාජනය නොවන අවස්ථාවක අපි මේ නගර සභාව තුල නගරයට වෙන හානියක් විදියට තමයි මේක දකින්න පුලුවන්. නගරයට විතරක් හරියන විදියට චක්‍රලේඛන හදන්න බැහැයි කියන මතය තුල මේක බැහැර වෙනවා. සභාපතිතුමනි මේ ප්‍රශ්නෙදි දේශපාලන නායකත්වය මූලිකත්වය ගත යුතුයි අපේ මන්ත්‍රීවරුන් පැවසූ ආකාරයට. එතකොටයි අමාත්‍යවරයාගේ හෝ ගරු ජනාධිපතිතුමාගේ අවධානය යොමු වෙන්නෙ. මම දකින්නෙ මේ යෝජනාව පළාත් සභාව හරහා ඒ වාද විවාද වලට ඇතුල් කරල ඒ හරහා ගරු අධ්‍යාපන අමාත්‍යවරයා වෙත යනව නම් වඩා ඵලදායි වේවි. රටේ අධ්‍යාපන පද්ධතිය සකස් වෙලා තියෙන්නෙ ජාතික පාසල් සහ පළාත් සභා පාසල් කියන දෙආකාරයකට සකස් වෙලා තියෙනවා. මෙතන සියලු කටයුතු වලදි ක්‍රමවේද දෙකක් ක්‍රියාත්මක වෙන්නෙ. නමුත් ළමුන් ඇතුලත් කර ගැනීමේදි පමණක් චක්‍රලේඛනය එකක්. එතනයි අපට මේ ප්‍රශ්නෙට ප්‍රවේශ වෙන්න තියෙන්නෙ. ජාතික පාසල් කියන්නෙ ඉතා සුපිරි තත්වයේ පාසල්. ජාතික පාසලකට තමන්ගෙ ළමය දාගන්න පුලුවන්නම් පළාත් සභා පාසලකට ඇතුලත් කරන්නෙ නෑ. මේ ප්‍රශ්නය තර්ක විය යුත්තේ පාර්ලිමේන්තුවේ මිස මෙතන නෙමෙයි. අපට චක්‍රලේඛන වෙනස් කිරීමේ බලය නෑ. අපි හැමදාමත් ලේකම්තුමාගෙන් ඉල්ලුවට මේක කෙරෙන්නෙ නෑ. මේකට එක විසඳුමක් විදියට පළාත් සභා පාසලකට ලකුණු පහ කැපීම ඉවත් කිරීම කාලෝචිතයි. මේක හරිහැටි තේරුම් කරල වාද විවාද කරල දේශපාලන අධිකාරිය මගින් මේක විසඳගන්නව මිසක් ලියුම් දහසක් දැම්මත් මේක විසඳගන්න බැහැ සභාපතිතුමනි. ජයන්ත මන්ත්‍රීතුමා කිව්ව පාසල් හතරම වැරදි විදියට තමයි ළමයි ඇතුලත්කර ගන්නෙ කියලා. මමත් ඒක අනුමත කරනවා. වැරදි කෙසේ වෙතත් මම අභියෝග කරනවා අධ්‍යාපන අධ්‍යක්ෂකතුමිය ඇතුලු අම්බලන්ගොඩ ප්‍රදේශයේ සියලුම විදුහල්පතිවරුන්ට පුලුවන්නම් 2012 වසරේ නිවැරදිව ඇතුලත් කරපු නාම ලයිස්තු ඉදිරිපත් කරන්නයි කියලා. මේක තමයි ඇත්ත කතාව. මම මේ සභාවෙ අධ්‍යාපන ප්‍රශ්නය ගැන කතා කරපු හැමදාම කියල තියෙනවා මේ ගරු මන්ත්‍රීවරුන්ටත් මේකෙ කොටසක් තියෙනව කියලා. මේක ප්‍රායෝගික ප්‍රශ්නයක්. ඒකෙ අවසන් ප්‍රතිඵලය මේ ගමේ ජනතාවගේ අයිතිය මංකොල්ල කාගන්න ක්‍රම කීපයක් තියෙනවා. අයිතිය පිළිබඳව ඔප්පුව ඉදිරිපත් කරන්නම ඕනෙ. චක්‍රලේඛනයේ තියෙන්නෙ ඔප්පුව තියෙනවනම් තමයි නීත්‍යානුකූල ලියවිල්ල වෙන්නෙ. උපන්දා ඉඳල පදිංචි කෙනාට ඔප්පවකු නැත්තම් ඒ ලකුණු හම්බවෙන්නෙ නැහැ. ඔප්පුවට ලකුණු 10 ක් දෙනවා. ගමේ ඉන්න සේරම අනවසර ගෙවල් තියෙන අයගෙ ළමයි එළියෙ. මේ නීතියයි හදන්න ඕනෙ. චක්‍රලේඛනයට නව සංශෝධන ඇතුලත් කරන්න ඕනෙ. මේ විදියට පළවන වසරෙදි නවත්තගන්න ඇතුලත් කිරීම් 2,3,4,5 වසර වලදි තව 10 දෙනෙක් විතර ගන්නවා. ඒ දේශපාලන සහ ඉහල බලපෑම් වලට. මේ විදියට අවුරුද්දක් ඇතුලත ළමයි 50 ක් 60 ක් ගන්නවා. මේ අයිතිය ගමේ ළමුන්ගෙ අයිතිය සාහසික ලෙස උදුරගෙන අමාත්‍යාංශ ලේකම්වරය නිර්දේශ කරල එවන්නෙ. අපි මේ කතා කරන්නෙ මේ ගමේ ඉපදිච්ච ස්ථිර පදිංචි අයගෙ දරුවන් වෙනුවෙන්. කිසිම පාසලකට විරුද්ධවවත් ද්වේෂසහගතවත් නෙමෙයි. මේ සම්බන්ධව දරුවන්ගේ අධ්‍යාපනය කඩාකප්පල් වීමට කලින් මේකට නිසි විසඳුමකට යායුතුයි කියල මම ඉල්ලා සිටිනවා සභාපතිතුමනි. මෙම යෝජනාව මහ ඇමතිතුමා හරහා පළාත් සභාවේ වාද විවාද කරල අමාත්‍යාංශෙට යවන එක සුදුසුයි කියල මම පළමුව කියා සිටිනවා. දෙවනුව අපි මන්ත්‍රී මඩුල්ල අධ්‍යාපන අමාත්‍යාංශෙ ලේකම්තුමා හමුවීම කල යුතුයි කියන දෙය මම කියා සිටිනවා.

<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මෙහිදී මම කියන්න ඕනෙ යම් මන්ත්‍රීවරයෙක් යෝජනාවක් ගෙනාවහම ඒම න්ත්‍රීවරයා ඒ කාලසීමාව තුල සභාවේ රැඳී සිටින්න ඕනෙ. මොකද ඒ මන්ත්‍රීවරයා පිළිතුරු කතාව කරන්න ඕනෙ. ඒවගේම සහෝදර මන්ත්‍රීවරයෙක් කතා කරන කොට අනෙක් මන්ත්‍රීවරු කතා කරන්න එපා. ඇහුන්කම් දීම ඉතාම වැදගත්. අනික් කරුණ යෝජනාවට අදාලව කතා කරන්න අවශ්‍යයි. මේ කරුණු තුනම මන්ත්‍රීවරු සිහි තබා ගන්න. ඒවගේම යෝජනාවකට අවශ්‍ය තමන්ගේ විනය පවත්වාගෙන යාම විශේෂයෙන්ම වැදගත් වෙනවා. ඒ නිසා මම සියලු මන්ත්‍රීවරුන්ට කාරුණිකව මේ කරුණු තුන දන්වා සිටිනවා. මේ යෝජනාවට මගේ එකගතාවය පල කර සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි මේ යෝජනාව සම්බන්ධව මන්ත්‍රීවරු අදහස් පල කරා. මෙහිදී කෙරන්න ඕනෙ චක්‍රලේඛනයේ තියෙන අඩුපාඩුකම් අපි පෙන්වා දෙන්න ඕනෙ. නගරයේ ජනතාවට මේ ළමයින් ඇතුලත් කිරීමේ ප්‍රශ්නය දැඩිව බලපානවා. චක්‍රලේඛන වෙනස් කිරීම කරන්න පුලුවන්. සභාපතිතුමනි අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්තුමා හමුවෙන්න දිනයක් දාගන්න ඕනෙ. මහ ඇමතිතුමාත් මේ සම්බන්ධව දැනුවත් කරල මේ කටයුත්ත කරන්න ඕනෙ. මන්ත්‍රීවරු මේ සඳහා උද්ඝෝෂණයකට වුනත් යන්න ලෑස්තියි. අපි මේක දකින්නෙ නගරයේ ජනතාවගේ දැවෙන ප්‍රශ්නයක් ලෙසයි. ඒ නිසා මේ සම්බන්ධයෙන් ඔබතුමා පුමුඛව කටයුතු කරන්න කියා මා ඉල්ලා සිටිමින් මේ සම්බන්ධයෙන් අදහස් දැක්වූ සියලු මන්ත්‍රීවරුන්ට ස්තූතිය පුද කරමින් නිහඩ වෙනවා.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

**5:1:2** ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා, ජේ. ඩබ්. ජයන්ත මහතා, ආර්. පී. දේව් රොහාන් මහතා, කේ. එම්. චන්ද්‍රසිරි මහතා, ඒ. ඩබ්. ජගත් කුමාර මහතා, පී.සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා, එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා, ඒ. පී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය, එඩ්. කමල් ද සිල්වා මහතා, එච්. එල්. අනුර කිත්සිරි මහතා යන අය විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව.

**අම්බලන්ගොඩ නගර වැසි ජනතාව වෙනුවෙන් නගර සභාව විසින් සපයනු ලබන සේවාවන් අතර නගර වැසියෙකුගේ අවමංගල්‍ය කටයුත්තකදී ආදාහනාගාර පහසුකම් සැපයීමේදී සමෘද්ධිලාභීන්හට සහන ගාස්තුවක් පමණක් අය කරන අතර සමෘද්ධිලාභීන්ටත් වඩා පහල මට්ටමක සිටින මහජන ආධාර ලබන අයකුගේ අවමංගල්‍ය අවස්ථාවකදී ද ආදාහනාගාර පහසුකම් ලබා දීමේදී සමෘද්ධිලාභීන්ට හිමි සහනාධාරය ලබා දිය යුතු යැයි මෙම සභාවට යෝජනා කර සිටිමු.**

**ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි අපට යම් සිද්ධියක් වුනහම තමයි ඒ දේ දැනෙන්නෙ. පොල්වත්ත ප්‍රදේශයේ අවමංගල්‍ය අවස්ථාවකදී මට දැනගන්න ලැබුන මහජන ආධාර ලබන අයට සමෘද්ධි සහානාධාරය ලබන අයට ලබා දෙන සහනය ලබා දෙන්නෙ නැති වග. මම මේ ගැන සමෘදුධි නිලධාරීගෙන් විමසීම් කල විට දැනගන්න ලැබුන අවු 70 දි සමෘද්ධි සහනාධාරය අහිමි වෙනව ඒ අය මහජන ආධාර වලට දානව කියල. මෙතන ආධාරවලට සහනයක් දෙන ක්‍රමවේදයක් නැහැ. ඒඅ යටත් මේ සහනය ලබා දීම අපේ යුතුකමක් කියන එක පදනම් කරගෙන තමයි මේ යෝජනාව ගෙනාවේ. එනිසා මම ඉල්ලා සිටිනවා ඒ අයටත් මේ සහනාධාරය ලබා දෙන්නයි කියලා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි ජනිත් මන්ත්‍රීතුමා ගෙනා යෝජනාව ඉතා වැදගත් යෝජනාවක්. අපි නොදකින පැත්තක් එතුමා දැකල තියෙනවා. මේකට අපි සියලු දෙනාම එකග වෙනවා. ඒ නිසා එම යෝජනාව ක්‍රියාත්මක කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

ඉතාමත් එලදායි සහ අත්‍යවශ්‍ය කරුණක් බව පෙනී යන බැවින් සමාජසේවා දෙපාර්තමේන්තුවෙන් ආධාර ලබා දෙන අවුරුදු 70 ට වැඩි අය සඳහා එහි නිර්දේශය පරිදි ආදාහනාගාරය වෙන් කිරීමේදී ගාස්තු අඩු කිරීම යෝග්‍ය බවට සභාව තීරණය කරන අතර ඉදිරියේදී එම සහනය ලබා දීමට කටයුතු කරන්න.

ඉහත සඳහන් යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.**

## 5:2 නිලධාරීන් විසින් ඉදිරිපත් කරන පරිපාලන යෝජනා

**5:2:1** " ප්‍රදේශයේ සුවිශේෂී තැනැත්තන්ගෙන් හා නගර සභා සභිකයන්ගෙන් සැදුම්ලත් සංවර්ධන උපදේශක කාරක සභාවක් අම්බලන්ගොඩ නගර සභාවේ පිහිටුවා පවත්වාගෙන යාමට සුදුසු බවට මෙම සභාවට යෝජනා කරන්නිය ".

අම්බලන්ගොඩ නගර සභාවේ නගර සභිකයන්ගෙන් සහ ප්‍රදේශයේ සුවිශේෂී හැකියාවන් සහිත ප්‍රජා නියෝජිතයන්ගෙන් සමන්විත සංවර්ධන උපදේශක කාරක සභාවක් පිහිටුවීම සුදුසු බව ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.

සංවර්ධන උපදේශක කාරක සභාවේ ප්‍රජා කමිටු සාමාජිකයන් වශයෙන් පහත නම් සඳහන් අය පත් කිරීමට ද සභාවේ අනුමැතිය ලබා දෙන ලදී. (කොට්ඨාශයට අදාල ගරු මන්ත්‍රීවරයා විසින් නම් ඉදිරිපත් කරන ලදී)

මහ අම්බලන්ගොඩ කොට්ඨාශය - සුසිල් මාදුවගේ මහතා, ඕකන්ද කොට්ඨාශය - එච්. එච්. මහින්දසේන මහතා, පොල්වත්ත කොට්ඨාශය - පී. ඩබ්. ගුණසිරි මහතා, තල්ගස්ගොඩ කොට්ඨාශය - පී. පී. ආරියරත්න මහතා, පනියන්දූව කොට්ඨාශය - ෂර්ලි චන්ද්‍රසිරි මහතා, පෝරඹ කොට්ඨාශය - බර්ට් රණසූරිය මහතා, හිරේවත්ත කොට්ඨාශය - හැළඹගේ ලලිතසිරි මහතා, විලේගොඩ කොට්ඨාශය - උපසේන සමරසිංහ මහතා, හෙප්පුමුල්ල කොට්ඨාශය - අනිල් කෝලිත මහතා, කලුවඩුමුල්ල කොට්ඨාශය - කමලසිරි වරුෂවිතාන මහතා, පටබැඳිමුල්ල කොට්ඨාශය - ජනක ප්‍රසාද් මහතා, කන්ද කොට්ඨාශය - නන්දසෝම මහතා, කෙරමිණිය පින්නදූව කොට්ඨාශය - ආචාර්නි ඕ. රෝහිනී ගුණධීර මහත්මිය.

**ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.**

## (06) කාරක සභා වාර්තා සලකා බැලීම

**6: 1** **2013- 06- 24** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද කළමනාකරණ කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

**අම්බලන්ගොඩ නගර සභාව**

**කළමනාකරණ කමිටු වාර්තාව**

| | | | | |
|---|---|---|---|---|
| **දිනය** | : | **2013.06.24** | | |
| **ස්ථානය** | : | **නගර සභාව, අම්බලන්ගොඩ** | | |
| **වේලාව** | : | **පෙ.ව. 02.30** | | |
| **සහභාගීත්වය** | : | | | |
| | | **ඩී. වී. සුනිල් මයා** | - | **ලේකම්** |
| | | **ඩී. ඩබ්. පත්මසිරි මයා** | - | **ගණකාධිකාරී** |
| | | **එම්. ඩබ්. සිසිර කුමාර මයා** | - | **කර්මාන්ත අධිකාරී** |
| | | **එච්. එච්. ජයසේන මයා** | - | **මහජන සෞඛ්‍ය පරීක්ෂක** |
| | | **ශාන්ති ඩී. රාමනායක මිය** | - | **ප්‍රධාන කළමනාකරණ සහකාර** |
| | | **කේ. සී. සී. ප්‍රනාන්දු මිය** | - | **අභ්‍යන්තර විගණන නිලධාරී** |
| | | **ඩබ්. පී. සිල්වා මිය** | - | **ප්‍රජා සංවර්ධන නිලධාරී/සංවර්ධන සහකාර** |
| | | **කේ. එච්. මෙලානි මධුෂා** | - | **පුස්තකාලයාධිපති** |
| | | **මංජරී ත්‍යාගා සමරසේකර මිය** | - | **සංවර්ධන සහකාර** |

- 01. පිළිගැනීම. - **ලේකම්**

- කළමනාකරණ කමිටුව පැවැත්වීම සඳහා 3.30 වනතුරුත් නිලධාරින් නොපැමිණීම ගැටලුවක් බව. - **ලේකම්**

2011 වර්ෂයේ කාර්ය සාධන තරඟයේ ලකුණු මට්ටම මේ වන විට ලැබී ඇති බවත් 2010 වර්ෂයේ දී කාර්යසාධන ලකුණු මට්ටම 225.75 ක් බවත් 2011 වර්ෂයේ දී 314.50 ක් ලබා ගෙන ඇති බවත් ඒ අනුව මේ වනවිට ආයතනය ඉන්න මට්ටම දැකිය හැකි බවත් එමෙන්ම අඩු පාඩු තිබෙන විෂයය කොටස් දැකිය හැකි බවත් ඒවායේ අඩුපාඩු පවතිනුයේ නිසි පරිදි ලේඛන නඩත්තු නොකිරීම මත පමණක් බවත් ප්‍රජා සේවා, කළමනාකරණ කමිටු නොපැවැත්වීම හා සැපයුම් විෂය ආදිය නිදසුන් ලෙස දැක්විය හැකි බවත් පෙන්වා දෙන ලදී. ඒ අනුව 2012 වර්ෂයේ දී මෙම ලකුණු මට්ටමට වඩා ඉහළ ලකුණු මට්ටමක් ලබා ගැනීමට හැකි වන බව තම විශ්වාසය බවත් මේ සඳහා වගකීමෙන් හා කැපවීමෙන් කටයුතු කරනු ලබන ආයතනයේ සියලු නිලධාරීන්ට තම ස්තුතිය හිමි වන බවත් කාර්ය සාධන විෂයය භාර මංජරී මහත්මියට විශේෂ ස්තුතියක් හිමි වන බවත් 2013 වර්ෂයේදී සියලු අඩුපාඩු සකස් කර ගෙන ඉදිරියටම යා හැකි බවත් පවසා සිටින ලදී.

- ලෝක පරිසර දිනය නිමිති කරගනිමින් විශේෂ ඩෙංගුමර්ධන වැඩසටහනක් මෙම මස 08 වන සෙනසුරාදා- **ලේකම්**

දින ඉතා සාර්ථකව පැවැත්වූ බවත් අප කාර්යාලයේ නිලධාරීන්, සේවකයන් බොහෝ දෙනෙක් සහභාගී වූ බවත් එමෙන්ම කරන්දෙණිය යුධ හමුදා මධ්‍යස්ථානයේ නිලධාරීන්, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ නිලධාරීන්, අම්බලන්ගොඩ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ නිලධාරීන්, අම්බලන්ගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් මේ සඳහා සහභාගී වූ බවත් එය අම්බලන්ගොඩ නගරවාසීන්ගේ හා වෙළඳ ප්‍රජාවගේ දැඩි ප්‍රසාදයට ලක් වූ බවත් වෙළඳ

සංගම් කම්ටුවේදී පවා එම වැඩසටහන පිළිබඳව ස්තුති කළ බවත් මෙම වැඩසටහනට සහභාගී වූ සියලු නිලධාරීන් ටත් ස්තුතිවන්ත වන බවත් ආයතනයේ සියලු වැඩසටහන් සඳහා අප ආයතනයෙන් සහභාගී වූ නිලධාරීන්ට වර්ෂාව සානයේ දී ප්‍රශංසා සහතික ලබා දිය යුතු බවත් පවසා සිටින ලදී.

❖ එය අනිවාර්යයෙන්ම කළ යුතු බවත් ආයතනයේ අනෙකුත් වැඩසටහන් සඳහා උනන්දුවක් ඇති කිරීමටත් - **මහජන සෞ.ප.** එය යහපත් බව.

❖ ප්‍රධාන කළමනාකරණ සහකාර හරහා ප්‍රශංසා ලිපි ලබා දීම ඉක්මණින් සිදු කළ යුතු බවත් එම වැඩසටහන- **ගරු සභාපති** සඳහා වෙළඳ සංගමය විසින් රු. 14000/- ක මුදලක් ද ලබා දුන් බවත් නැගෙනහිරු පදනමද රු. 35000/- ක් පමණ වටිනා පැළ වර්ග 250ක් ලබා දුන් බවත් එම ආයතනයන්ට ද මෙහිදී විශේෂ ස්තුතියක් පිරිනමන බවත් ඩෙංගු මර්ධන වැඩසටහන සඳහා සහාය ලබා දුන් රජයේ අනෙකුත් ආයතන වල නිලධාරීන්ටද ප්‍රශංසා සහතික ලබා දීමට කටයුතු කිරීම සුදුසු බව දන්වා ලිපියක් යැවීම සුදුසු බවත් පවසා සිටින ලදී.

➢ **ආයතනයේ විශේෂ වැඩසටහන් වෙනුවෙන් සහභාගී වන නිලධාරීන්ට හා සේවකයන්ට ප්‍රශංසා සහතික ලබා දීම සුදුසු බවට කළමනාකරණ කමිටුව තීරණය කරන ලදී.**

**මූල්‍ය කළමනාකරණ අංශය පිළිබඳව සාකච්ජා කිරීම**

❖ ගියවර කළමනාකරණ කමිටුවේ දී සාකච්ජා කළ පරිදි මාසික සභාවට ඉදිරිපත් කරන ලද නගර සභා - **ගණකාධිකාරී** ආදායම් හා වියදම් පිළිබඳව වූ ගිණුම් වාර්තාවේ යෝජනා 03න් පළමු යෝජනාව සම්බන්ධව පිළිතුරක් ලබා දෙනු ලැබූ බවත් එනම් හිඟ ආදායම් පිළිබඳව රැස්වීම් පවත්වා එහි ප්‍රගතිය පිළිබඳව සතිපතා සාකච්ජා කර එහි වාර්තා කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කරන ලෙසත් පසුගිය සතිය තුළ නොවැළැක්විය හැකි හේතුවක් මත හිඟ ආදායම් පිළිබඳ රැස්වීම පැවැත්වීමට නොහැකි වූ නමුත් එය දිගින් දිගටම පැවැත්වීමට කටයුතු කරන බවත් පවසා සිටින ලදී.

❖ දෙවන යෝජනාව වූ කඩ කුලී ආදායමෙන් තුනෙන් එකක මුදල නගර අලංකරණ ගිණුමට බැර කිරීම - **ගණකාධිකාරී** වෙනුවට පොදු ගිණුමට බැර කිරීම සුදුසු බවත් එසේ නොකිරීම නගර සභාවේ මූල්‍ය කටයුතු වලට විශාල බාධාවක් බවත් කඩකුලී තුනෙන් එකක මුදල නැවත පොදු ගිණුමට බැර කිරීම සඳහා සභාවට යොමුකර අනුමත කර ගැනීම සුදුසු බවත් ණය හිමියන් දුරකථනයෙන් තමා අමතා ඔවුන්ගේ මුදල් නොගෙවීම මත බැණ වදින බවත් විශාල ණය මුදලක් ගෙවීමට ඇති බවත් එම මුදල් සියල්ලම පුනරාවර්ථන වියදම් බවත් දැනට ආයතනයේ ඇති මුදල් වියදම් පියවීමට ප්‍රමාණවත් නොවන බවත් ගියවර කළමනාකරණ කමිටුවට සවිස්තර වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබුයේ එබැවින් බවත් පවසා සිටින ලදී. එමෙන්ම ඉදිරිපත් කරන ලද තෙවන යෝජනාව සම්බන්ධයෙන් ද තීරණයක් ලබා නොදුන් බවත් ඒ සඳහා ද පිළිතුරක් ලබා දිය යුතු බවත් ඉන් අනතුරුව මේ පිළිබඳව තමා සාකච්ජා නොකරන බවත් හැකි ඉක්මණින් ගියවර කළමනාකරණ කමිටුවේ දී ඉදිරිපත් කරන ලද යෝජනා දෙක සම්බන්ධව විසඳුමක් ලබා දෙන ලෙසත් ඉල්ලා සිටින ලදී.

❖ එමෙන්ම නගර සභාව විසින් පවත්වනු ලබන උත්සව සඳහා අත්තිකාරම් ලබා ගැනීම කිසිදු වග විභාග - **ගණකාධිකාරී** යකින් තොරව සිදු කරන බවත් මින් පසු අත්තිකාරම් ඉල්ලන්නේ නම් ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර නිර්දේශ හා අනුමැතිය ලබා ගෙන ඉදිරිපත් කළ යුතු බවත් වියදම පිළිබඳ තක්සේරුවක් ද නොමැතිව හෙට උත්සවය තිබේ නම් අද අත්තිකාරම ඉල්ලීම සුදුසු නොවන බවත් පවසා සිටින ලදී.

❖ නගර සභාවේ ලදුපත් නිකුත් කිරීම පෙ.ව. 8.45 සිට ප.ව. 3.00 දක්වා නිකුත් කරන බවත් ඒ අනුව ප.ව. - **ගණකාධිකාරී**

3.15 වන විට මූල්‍ය කළමනාකරණ (ආදායම්) අංශයේ අංශ ප්‍රධානි වෙත ලබා දිය යුතු බවත් 3.30 වන විට තමාට ලැබිය යුතු බවත් සංවර්ධන අංශයේ උපලේඛන අදාළ දිනයේ දී පමණක් නොව ඊට පසු දින හෝ ලබා නොදෙන බවත් එමනිසා එම අංශයේ උපලේඛන චාන්දනී මහත්මියට 3.15 වන විට ලබා දී 3.30 වන විට තමාට ලබා දිය යුතු බවත් ගිණුම් අංශයේ උපලේඛන 3.15 වන විටම තමාට ලැබිය යුතු බවත් පරිපාලන අංශයේ උපලේඛන එම අංශයේ අංශ ප්‍රධානි වෙත 3.15 වන විට ලබා දී 3.30 වන විට තමාට ලබා දිය යුතු බවත් අවධාරණය කරන ලදී.

❖ අභ්‍යන්තර විගණන වැඩසටහනක් හඳුන්වා දීමට ට්‍රාන්ස් පේරන්සි ආයතනය විශාල උනන්දුවක් දැක්වීම - **ගණකාධිකාරී** මත මේ වන විට වැඩසටහනක් ලබා දී ඇති නමුත් එය පොදු වැඩසටහනක් බවත් එහි සංශෝධනය විය යුතු හෝ එයට ඇතුළත් විය යුතු කරුණු පිළිබඳව වාර්තාවක් හැකි ඉක්මණින් ට්‍රාන්ස් පේරන්සි ආයතනයේ දිල්ශාන් මහතාට යැවිය යුතු බවත් එම වැඩසටහනේ වැය කොටස පිළිබඳව තමා විසින් අධ්‍යනය කරන බවත් අනෙක් අංශ ප්‍රධාන මහත්ම මහත්මීන් තමාට අදාළ අංශයේ කටයුතු පිළිබඳව අධ්‍යනය කළ යුතු බවත් පියතිස්ස රණසිංහ මහතා විසින් ලබා දුන් අභ්‍යන්තර විගණන වැඩසටහන හෝ අප ආයතනයට ගැලපෙන පරිදි සකස් කළ යුතු බවත් පෙන්වා දෙන ලදී.

❖ එමෙන්ම පළාත් පාලන ආයතන සියල්ලටම පාහේ පවතින ගැටලුවක් වූ පළාත් පාලන ආයතනවල විශ්‍රාම- **ගණකාධිකාරී** වැටුප් දායක මුදල් ගෙවීම සම්බන්ධව 2013 මැයි මස 17 වන දිනැති ලිපිය අනුව අප ආයතනයට අදාළ විශ්‍රාමික වැටුප් දායක මුදල් (රු. 9931520.26) මේ දක්වාම ගෙවීමට කටයුතු කර නොමැති බැවින් කොටස් වශයෙන් හෝ ගෙවන ලෙසට දන්වා එවා ඇති බවත් දිගින් දිගටම මේ සම්බන්ධව නගර සභාව දැනුවත් කිරීමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව කටයුතු කර ඇති බවත් එහිදී අප විසින් කළ යුතු කාර්යයන් හා ඒ සම්බන්ධ චක්‍රලේඛ පවා එවා ඇති බවත් මෙම චක්‍රලේඛ අනුව පරිපාලනමය කටයුතු බොහෝ ප්‍රමාණයක් පවතින බවත් චක්‍රලේඛ අධ්‍යනය කර කළ යුතු කාර්යයන් සිදු කිරීමට පියවර ගන්නා ලෙසත් සියලු ඉල්ලුම් පත්‍රද එවා ඇති නමුත් අනියම් සේවකයන් ගේ දායක මුදල් සම්බන්ධව මේ වන තුරුත් කිසිදු කාර්යයක් කර නොමැති බවත් මේ සඳහා ද කඩිනම් විසඳුමක් ලබා දෙන ලෙස ද සෑම මාසයකම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් මෙවැනි බිල්පතක් අප වෙත එවන බවද පවසා සිටින ලදී.

❖ අතීතයේ දී විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට මෙම දායක මුදල් නොයැවීම හේතුවෙන් හිඟ වූ මුදල් - **ලේකම්** සම්බන්ධව කළ යුත්තේ කුමක්ද යන්න පිළිබඳව විමසා සිටින ලදී.

❖ හිඟ මුදල් ඇතුළුව සියලුම මුදල් ගෙවීමට සිදු වන බවත් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සමග හෝ - **ගණකාධිකාරී** පළාත් පාලන දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කර විසඳුමක් ලබා දෙන ලෙස.

❖ හිටපු සභාපති පී. එම්. එස්. ද සිල්වා මහතා ද ඒ මහතාගේ පාලන කාලය තුළ දී ද ඉහත දායක මුදල් - **ගණකාධිකාරී** ගෙවීමට එකග වී සිට ඇති බවත් ඒවා වාරික වශයෙන් හෝ ගෙවීම් කිරීමට ලබා දෙන ලෙස ඉල්ලා ඇති බවත් ලිපිගොනුව පරිදි පෙන්වා දෙන ලදී.

❖ අප විසින් දායක මුදල් බැර කර ඇත්තේ සේවක අර්ථ සාධක අරමුදලට බවත් ඒවා නැවත රාජ්‍ය සේවක - **ලේකම්** අර්ථ සාධක අරමුදලට හැරවීමක් කළ නොහැකි ද යන්න විමසා සිටින ලෙසත් යෝජනා කරන ලදී.

➢ **නගර සභාවේ ආදායම් හා වියදම් තත්වය පිළිබඳව කරනු ලබන යෝජනා පිළිබඳව නැවත මාසික සභාවේ දී සළකා බලා විසඳුමක් ලබා දීමට කටයුතු කිරීමට කළමනාකරණ කමිටුව තීරණය කරන ලදී.**

- **උත්සව අත්තිකාරම් ලබා ගැනීමේ දී ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර නිර්දේශ හා අනුමැතිය ලබා ගත් පසු අත්තිකාරම් ලබා දීමට කළමනාකරණ කමිටුව තීරණය කරන ලදී.**
- **සෑම අංශයකම උපලේඛන ප.ව.3ග 15 වන විට අංශ ප්‍රධානීන්ට ලබා දී ප.ව.3ග 30 වන විට ගණකාධිකාරී වෙත ලබා දිය යුතු බවට කළමනාකරණ කමිටුව තීරණය කරන ලදී.**

**සංවර්ධන හා සැළසුම් අංශය පිළිබඳව සාකච්ඡා කිරීම.**

- මේ වන විට ටේලර් එකක වැඩ අවසන් කර ඇති බවත් අනෙක් ටේලර් තුනෙහි වැඩ ආරම්භ කර ඇති බවත් අදාළ කාර්යයන් එක දිගටම කිරීමට ඇති ඉඩ ප්‍රස්ථාව අඩු වී ඇති බවත් වෙනත් වෙනත් රාජකාරීන් ද පැවරීම හේතුවෙන් ටේලර් සකස් කිරීමේ කටයුතු ප්‍රමාද වූ බව. - **වැඩ අධිකාරී**

- සන්නිවේදනයේ දුර්වලතාවයක් මත කිසියම් ගැටලුවක් මතු වූ බව. - **ලේකම්**

- ට්‍රැක්ටර් ටේලර් වල වැඩ අවසන් වූ පසු වාහන අංගනයේ කටයුතු ආරම්භ කිරීමට කටයුතු කරන බව. - **වැඩ අධිකාරී**

- ඕල්ටනේටර් කේබල් නොමැති හෙයින් ට්‍රැක්ටර් වල එන්ජිම උදෑසන සිට සවස් වන තුරුම පණ ගන්වා තබා ගැනීමට සිදුව ඇති බව. - **ලේකම්**

- මේ වන විට ඕල්ටනේටර් කේබල් ගෙනැවිත් තිබෙන බවත් කැබ් රථයේ වැඩ කටයුතු අවසන්වූ පසු ට්‍රැක්ටර් වලට ඒවා සවි කළ හැකි බව. - **වැඩ අධිකාරී**

- රථ වාහන වල සිදුවන හදිසි අලුත්වැඩියා කිරීම් වලට අවශ්‍ය මූල්‍ය පහසුකම් නොමැති වීමත් ගබඩාවේ ද අවශ්‍ය බොහෝ අමතර කොටස් නොමැති වීමද ගැටලුවක් බවත් නිදසුනක් ලෙස ටයර් ටියුබ් වැනි දෑ ගබඩාවේ තිබිය යුතු බවත් පෙන්වා දෙන ලදී. - **වැඩ අධිකාරී**

- කර්මාන්ත අත්තිකාරම් මුදලෙන් බොහෝ විට වැඩි වියදම් සඳහා වන අලුත් වැඩියා කිරීම් වලට මුදල් ලබා දිය නොහැකි බවත් ගබඩා පොත්වල ද එවිට ඒවා ඇතුළත් නොවන බවත් එම හේතුව මත අත්තිකාරම් මුදල් නොදෙන- බවත් මූල්‍යමය තත්වය මත සැපයුම් නිලධාරීට භාණ්ඩ ගෙන්විය නොහැකි තත්වයක් උද්ගත වී ඇති බවත් පෙන්වා දෙන ලදී. - **ලේකම්**

- ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු බව හා විගණන විමසුමක් ඒමට පෙර එය කිරීම සුදුසු බව. - **ලේකම්**

- ඕල්ටනේටර් කේබල් ද සවි කර එය කිරීම සුදුසු බව. - **වැඩ අධිකාරී**

- නගර සභාවට අයත් පොදු වෙළඳ පොළවල් අලුත්වැඩියා කළ යුතු බව - **ලේකම්**

- අලුත්පාර වෙළඳ සංකීර්ණය අලුත්වැඩියා කළ යුතු අතර ඒ සඳහා ඇස්තමේන්තු සකස් කර ඇති බවත් මහා - **වැ අධිකාරී**

වීදියේ පොදු වෙළඳපොළ අලුත්වැඩියා කිරීම අනවශ්‍ය දෙයක් බවත් එය අපිරිසිදුව පවත්වා ගෙන යන බවත් එය රැක ගෙන පවත්වා ගෙන යාමට ජනතාව උත්සාහ නොගන්නා බවත් පෙන්වා දෙන ලදී.

**ප්‍රජා සේවා අංශය පිළිබඳව සාකච්ඡා කිරීම.**

- ප්‍රජා සේවා අංශයෙන් කළ යුතු විශාල වැඩ කොටසක් සිදු කිරීමට ඇති බවත් කියවීම් මාසය සඳහා - **ලේකම්** උත්සවය පැවැත්වීමටත් ඒ සඳහා ප්‍රතිපාදන සොයා ගැනීමට උත්සාහ කිරීම කළ යුතු බවත් නගර ක්‍රීඩා උලෙළ, ලෝක ළමා දින උත්සවය හා පරිසර වැඩ කටයුතු ඉදිරියට කර ගෙන යාමටත් පුස්තකාල අතර පවතින තරගය සඳහා සුදානම් වීමටත් අවශ්‍ය වන්නේ නම් ස්වයං ඇගයීමක් කිරීම සුදුසු බවත් පවසා සිටින ලදී.

- හිරේවත්ත පුස්තකාලය නිරීක්ෂණය කිරීමට ගිය අවස්ථාවේ දී එය ඉතාමත් අපිරිසිදු තත්වයේ තිබූ බව. - **ප්‍රසං නිලධාරී**

- පුස්තකාල සහායිකාවන් පුස්තකාල පිරිසිදුව තබා ගැනීමට ක්‍රියා කළ යුතු බවත් අපිරිසිදු තත්වයේ පවති - **ලේකම්** න්නේ නම් ලොග් සටහනක් තබන ලෙසත් ඊළඟ වර්ෂයේ කාර්ය සාධනය බැලීමේ දී එවැනි සටහන් පිළිබඳව සළකා **ප්‍රකස** බැලිය යුතු බවත් මේ පිළිබඳව පුස්තකාල කමිටුවේ දී අවධාරණය කර දැනුවත් කළ යුතු බවත් මෙය පුස්තකාල සහායකයින්ගේ රාජකාරියේ කොටසක් බවත් පුස්තකාල හා ඒ අවට අපිරිසිදු නම් ඊළඟ වර්ෂයේ වැටුප් වර්ධකය අනුමත නොකරන ලෙසත් අවධාරණය කර පවසන ලදී.

- පොල්වත්ත පුස්තකාලයේ සනීපාරක්ෂක කටයුතු සඳහා වැසිකිළියක් නොමැති බවත් පොත් රාක්ක නොමැති- **ප්‍රසංනි** බවත් එහි සිටින පුස්තකාල සහායිකාව පවසා සිටි බව.

- පුස්තකාලයේ පොත් රාක්ක නොමැති වීම පිළිබඳව පසුගිය සෑම වර්ෂයකම පුස්තකාල සමීක්ෂණ වාර්තාවේ- **ප්‍රක සහකාර** ඇතුළත් කර ඇති බවත් 2012 වර්ෂයේ සමීක්ෂණ වාර්තාවේ දී වරකට එක බැගින් වන සේ හෝ පොත් රාක්ක ලබා දෙන ලෙසට තමා නිර්දේශ ඇතුළත් කර ඇති බවත් පවසා සිටින ලදී

- රාක්ක සෑදීමට සුදුසු ලී වල අඩුවක් ඇති වූ බවත් එබැවින් රාක්ක සකස් කිරීමේ දී ගැටලු මතු වූ බවත් එම - **වැඩ අධිකාරී** නිසා රාක්ක මිල දී ගැනීම සුදුසු බව.

- **පොල්වත්ත පුස්තකාලයේ අඩුපාඩු සභාවට යොමු කර තීරණයක් ගැනීමට කළමනාකරණ කමිටුව තීරණය කරන ලදී.**

**සෞඛ්‍ය හා පරිසර අංශය පිළිබඳව සාකච්ඡා කිරීම**

- කසළ බැහැර කරන ස්ථානය පිළිබඳව වඩාත්ම සැළකිලිමත්ව හා සුපරීක්ෂාකාරීව වැඩ කටයුතු කළ යුතු - **ලේකම්** බව හා එසේ නොවන්නේ නම් ජනතා විරෝධයක් නැවත මතු විය හැකි බව.

- පස් කියුබ් ඇණවුම් කර ඇති බවත් කසළ තුනීකර ඒ මතුපිට පස් දැමිය යුතු බවත් විශේෂයෙන්ම මාර්ගය- **මසෞප** සකස් කළ යුතු බවත් පෙන්වා දෙන ලදී.

**පරිපාලන අංශය පිළිබඳව සාකච්ඡා කිරීම**

- සෞඛ්‍ය අංශයට සේවකයන් අවශ්‍ය බවට ඉල්ලා සිටින ලෙසත් සේවකයන් ස්ථිර නොකරන්නේ නම් සේවක- **ලේකම්** යන් නොපැමිණෙන බව.

- 1960 ගණන් වල අනුමත සේවක මණ්ඩල වාර්තාවක් තිබෙන බවත් ඒවා අලුත් කරන ලෙස ඉල්ලීමක් කිරීම- **මසෞප** සුදුසු බවත් පවසා සිටින ලදී.

❖ සංවර්ධන අංශයේ සේවක මණ්ඩල වාර්තාවද 1960 ගණන් වල අනුමත එකක් බවත් එබැවින් යම් පුරප්පාඩු - **වැඩ අධිකාරී** ප්‍රමාණයන් ඉල්ලා සිටින ලෙසත් පවසා සිටින ලදී.

**02. රැස්වීමේ වැඩ කටයුතු අවසන් කිරීම.**

❖ ස්තුති කථාව කිරීම සහ රැස්වීමේ වැඩ කටයුතු අවසන් කිරීම. - **ප්‍රධාන කළ: සහකාර**

සකස් කළේ : මංජරී ත්‍යාගා සමරසේකර (සංවර්ධන සහකාර)

අත්සන : ........................……….. දිනය

ලේකම්,
නගර සභාව - අම්බලන්ගො

**ඒ අනුව 2013 -06- 24 දින පවත්වන ලද කළමනාකරණ කමිටු වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**6: 2** **2013- 06- 18** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද වෙළඳ සංගම් කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.

**අම්බලන්ගොඩ නගර සභාව සහ වෙළඳ සංගමය ඒකාබද්ධව පවත්වනු ලබන**

**ක්‍රියාකාරී කමිටු වාර්තාව**

**දිනය** : **2013.06.18**

**ස්ථානය** : **නගර සභාව, අම්බලන්ගොඩ**

**වේලාව** : **ප.ව. 2.30**

**සහභාගීත්වය** :

**ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මයා - ගරු සභාපති, නගර සභාව, අම්බලන්ගොඩ**
**ඒ. ඩබ්. ජගත් කුමාර මයා - ගරු නගර සභා මන්ත්‍රී, නගර සභාව, අම්බලන්ගොඩ**
**අසිත ධනවංශ මයා - සම ලේකම්, වෙළඳ සංගමය, අම්බලන්ගොඩ**
**සුජීව සොයිසා මයා - භාණ්ඩාගාරික, වෙළඳ සංගමය, අම්බලන්ගොඩ**
**සමන් අත්තනායක මයා - උපභාණ්ඩාගාරික, වෙළඳ සංගමය, අම්බලන්ගොඩ**
**ඩී. වී. සුනිල් මයා - ලේකම්, නගර සභාව, අම්බලන්ගොඩ**
**මංජරී ත්‍යාගා සමරසේකර මිය - සංවර්ධන සහකාර, නගර සභාව, අම්බලන්ගොඩ**

01. පිළිගැනීම - **ගරු සභාපති, නගර සභාව**

❖ උත්තල දර්පණ ලබා දීම සම්බන්ධව පියාපියෝ ආයතනයෙන් ලිපියක් එවන ලද බව හා ඒ පිළිබඳව - **ගරු සභාපති, න.ස.** වෙළඳ සංගමයේ උප භාණ්ඩාගාරික සමන් මහතාටත් පියාපියෝ ආයතනයටත් ස්තුතිවන්ත වන බව.

❖ නගර සභාව විසින් දර්පණ සවිකර අවසන් වූ පසු එහි ඡායාරූප හා බිල්පත් ඉදිරිපත් කළ විට - **උපභාණ්ඩාගාරික** පියාපියෝ ආයතනයෙන් අනුමත කරන ලද මුදල ගෙවීමට කටයුතු කරන බව ඉහත ලිපියේ සඳහන් කර ඇති බව.

❖ අම්බලන්ගොඩ නගර සභාව විසින් 2013.06.08 වන දින පවත්වන ලද ඩෙංගු මර්ධන වැඩසටහන අතිශයින්ම සාර්ථක වූ බවත් එදින කාලගුණික තත්වය ඉතා නරක වුවත් නගර සභාවේ ගරු සභාපතිතුමන් එම වැඩසටහනට සහාය ලබා දුන් බවත් එයට සහභාගී වූ හමුදා නිලධාරීන්ට, පොලිසියට හා රජයේ සේවකයන් සියලු දෙනාටම විශේෂ ස්තුතියක් පල කර සිටින බවත් ඩෙංගු වැනි රෝගයක් අවම කිරීම සඳහා නගර සභාව වශයෙන් ක්‍රියාත්මක වීම ගැන ද නැවතත් ස්තුතිවන්ත වන බව පවසා සිටින ලදී. - **සමලේකම්, වෙළඳ සංගමය**

❖ ඩෙංගු මර්ධන වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා වෙළඳ සංගමය විසින් රු.14000/- ක මුදලක් ලබා දීම පිළිබඳව නගර සභාව වෙනුවෙන් තම ස්තුතිය පළ කර සිටින බවත් එමෙන්ම තම වෙළඳ සැල්වල වහල සහ පිටුපස කොටස පිරිසිදු කර ජලය රැඳී නොසිටින ලෙස පවත්වා ගෙන යන ලෙස වෙලඳ සංගමය විසින් ව්‍යාපාරික ප්‍රජාව දැනුවත් කරන ලෙස ඉල්ලා සිටින බවත් බොහෝ ව්‍යාපාරික ස්ථානයන් හි වහල කොන්ක්‍රීට් කර තිබීම නිසා ජලය රැඳී තිබෙන බවට අනාවරණය වී ඇති බවත් මෙහිදී ප්‍රධාන වගකීමක් වනුයේ අපගේ ව්‍යාපාරික ස්ථාන පිරිසිදුව පවත්වා ගෙන යාම බවත් වැඩිදුරටත් පවසා සිටින ලදී. - **ගරු සභාපති, න සභාව**

❖ වෙළඳ සංගමය විසින් කළ යුතු දේ කුමක්ද යන්න පිළිබඳව. - **වෙළඳ සංගමයේ නිලධාරීන්**

❖ විශේෂයෙන්ම ජලය රැඳී නොසිටින ලෙස ව්‍යාපාරික ස්ථානයේ වහල හා කොන්ක්‍රීට් තට්ටු පිරිසිදුව පවත්වා ගෙන යාමට හා ව්‍යාපාරික ස්ථානයන්හි පිටුපස පිරිසිදුව පවත්වා ගෙන යාමට ව්‍යාපාරිකයන් දැනුවත් කරන ලෙසත් දැනට වැඩිම ඩෙංගු රෝගීන් ප්‍රමාණයක් සිටිනුයේ ව්‍යාපාරික ස්ථාන ආශ්‍රිත ප්‍රදේශයන් වල බවට අනාවරණය වී ඇති බවත් එනම් විලේගොඩ.පොදු වෙළඳ පොළ ආශ්‍රිතව.පල්ලියබඩ වත්ත යනාදී ප්‍රදේශ පෙන්වා දිය හැකි බවත් එබැවින් ව්‍යාපාරික ප්‍රජාව දැනුවත් කිරීම අතිශයින් වැදගත් බවත් පෙන්වා දෙන ලදී. - **ගරු සභාපති ,න.ස.**

❖ අත් පත්‍රිකාවක් මගින් දැනුවත් කිරීම කළ හැකි බවත් මින් ඉදිරියට මදුරුවන් බෝවන ස්ථාන පිළිබඳව සොයා බලා නීතිමය පියවර ගන්නා බවත් තම යහපත වෙනුවෙන් හෝ ක්‍රියාත්මක වන ලෙසට දැනුවත් කිරීම කළ හැකි බව. - **සම ලේකම්, වෙ සං**

❖ අම්බලන්ගොඩ තානායමේ කඩා දමන ලද කොටසේ ජලය රැඳෙන ස්ථාන තිබෙන බවත් එයට ද අවධානය යොමු කරන ලෙස තමා ඉල්ලා සිටින බවත් දැනුවත් කිරීම පළමු අවස්ථාව බවත් දෙවන අවස්ථාවේ දී නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බවටත් ව්‍යාපාරිකයන් දැනුවත් කළ හැකි බව. - **උප භාණ්ඩාගාරික,**

❖ ඩෙංගු මර්ධන වැඩසටහන දිනයේ දී ඩෙංගු මදුරු කීටයන් හමු වූ ස්ථාන සඳහා අනිවාර්යයෙන්ම නීතිමය පියවර ගන්නා බව පවසා සිටින ලදී. - **ගරු සභාපති,**

❖ ඩෙංගු මර්ධන වැඩසටහන සඳහා වෙළඳ ප්‍රජාවගේ ද සහාය ලබා ගැනීමට හැකියාව තිබූ බව හා එසේ වුයේ නම් ව්‍යාපාරික ස්ථානයන් ද එදින පිරිසිදු කිරීමට හැකියාව තිබූ බව. - **ලේකම්, නගර සභාව**

❖ අපගේ සහාය ලබා දෙන ලෙස ඉල්ලීමක් කරනු ලැබුවේ නම් සහාය ලබා දීමේ හැකියාව තිබූ බව- **වෙළඳ සංගම් නියෝජිතවරු**

❖ නීතිමය පියවර ගන්නා බව පැවසූ විට පමණක් ව්‍යාපාරිකයන් තම ව්‍යාපාරික ස්ථාන පිරිසිදුව පවත්වා ගෙන යාමට උත්සාහ ගන්නා නමුත් නැවත ටික දිනකින් පෙර තත්වයටම පත් වන බව. - **භාණ්ඩාගාරික,**

❖ වෙළඳ සංගමය විසින් සංවිධානය කරනු ලැබූ වෙසක් තොරණ වෙනුවෙන් ස්ථානය ලබා දීමෙන් හා අවශ්‍ය- **උප භාණ්ඩාගාරික,**

සම්පූර්ණ සහාය ලබා දීම පිළිබඳව නගර සභාවේ ගරු සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයට විශේෂ **වෙළඳ සංගමය** ස්තුතියක් පිරිනමන බව

02. **රැස්වීමේ වැඩ කටයුතු අවසන් කිරීම**.

ස්තුති කථාව කිරීම සහ රැස්වීමේ වැඩ කටයුතු අවසන් කිරීම. -**ගරුනගරසභාමන්ත්‍රී,**
**ඒ.ඩබ්. ජගත් කුමාර මයා**

සකස් කළේ : .................................................
අත්සන : ..........................

ලේකම්,
නගර සභාව - අම්බලන්ගොඩ

**ඒ අනුව 2013 -06-18 දින පවත්වන ලද වෙළඳ සංගම් කමිටු වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**6: 3** **2013- 06- 11** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද ක්‍රීඩා කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා විසින් ස්ථිර කරන ලදී.

**<u>අම්බලන්ගොඩ නගර සභාව - ක්‍රීඩා කමිටු විශේෂ රැස්වීම</u>**

දිනය - **2013.06.11**
ස්ථානය - නගර සභා රැස්වීම් ශාලාව
වේලාව - ප.ව. 2.30

**<u>සහභාගීත්වය</u>**

ඇම්.ඩබ්.අරුණ ප්‍ර2දීප් මහතා - ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව
එච්.එල්. අනුර කිත්සිරි මහතා - ගරු නගර සභා මන්ත්‍රී , අම්බලන්ගොඩ නගර සභාව
සුගත් හෙට්ටිආරච්චි මහතා - ක්‍රීතඩා කමිටු සාමාජික .
ඒ.එල්.එස්. ද සිල්වා මයා - ඩොල්ෆින් ජල ක්‍රීඩා සමාජය
එස්.කේ.පත්මසිරි මහතා - ක්‍රීතඩා කමිටු සාමාජික .
මහේන්ද්‍ර. වික්‍රමසිංහ මහතා - ක්‍රීරඩා කමිටු සාමාජික .
ඩබ්.පී.සිල්වා මිය - සංවර්ධන සහකාර (ප්‍රස.සං. නිලධාරී වැ.බ)
එච්.ජී.දිලිනි චතුරිකා මිය - කළමණාකරන සහකාර

**පිළිගැනීම - ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍ර දීප් මහතා.**

කිරිගැඩා කමිටුව සඳහා කිර ඩා සමාජ නියෝජනය කරමින් පැමිණි නිලධාරීන්, ක්‍රීඩා කමිටු සාමාජික මහතුන් හා නගර සභා කාර්ය මණ්ඩලය ඉතාමත් ගෞරවයෙන් පිළිගනු ලබන බව ප්‍රකාශ කරන ලදි. ඉන් අනතුරුව න්‍යාය පත්‍රානුකූලව ප්‍රථමයෙන්ම පසුගිය ක්‍රීඩා කමිටු රැස්වීමේ කරුණු සමාලෝචනය කිරීම සිදු කරන ලදි.

**ගරු සභාපතිතුමා**

අද දින ක්‍රීඩා කමිටුව සඳහා නගර සභාවේ ක්‍රී ඩා භාර නිලධාරී හා ක්‍රීඩා භූමිය භාර නිලධාරී පැමිණ නොසිටීම පිළිබඳ විමසීම් කරන ලදි. ක්‍රීඩා කමිටුව සඳහා පැමිණීම ඔවුන්ගේ රාජකාරියේ කොටසක් බවත් මින් ඉදිරියට කමිටුව පැවැත්වෙන දිනවලදී ඒ සඳහා සහභාගී වීම අනිවාර්ය බව ඔවුන්ට ලිඛිතව දන්වන ලෙසටත් එසේ සහභාගි නොවන්නේ නම් විනයානුකූලව ක්‍රියා කරන ලෙසටත් විෂය භාර නිලධාරියාට උපදෙස් ලබා දෙන ලදි.

තවද ඊලඟ කමිටු වාරයේදී පසු ගිය කමිටුවේ තීරණ පිළිබඳ දැනුවත් කරන ලෙස දන්වන ලදි. ඉන් අනතුරුව 2013 නගර ක්‍රීඩා උළෙල පැවැත්වීම පිළිබඳ අදහස් විමසා සිටි අතර ,
එයට ඇතුළත් විය යුතු තරඟ ඉසව් හා පැවැත්විය යුතු කාල වකවානු පිළිබඳ අදහස් විමසා සිටින ලදි. මෙවර ක්‍රීඩා උළෙල ගාලු දිස්ත්‍රික්කයම නියෝජනය වන පරිදි පැවැත්වීම පිළිබඳ අවධානය යොමු කරන ලදි. දළ වශයෙන් සාදන ලද වියදම් ඇස්තමේන්තුව ගරු සභාපතිතුමා කමිටුව වෙත ඉදිරිපත් කරන ලදි.

<u>පැවැත්වීමට යෝජිත තරඟ</u>

- ක්‍රිකට් (වයස අවු 15න් පහළ)
- පාපන්දු ( වයස අවු 17න් පහළ)
- දැල් පන්දු ( වයස අවු 15න් පහළ)
- බැඩ්මින්ටන් ( වයස අවු 15/17 න් පහළ) (තනි, යුගල)
- මේස පන්දු ( වයස අවු 15/17 න් පහළ) (තනි, යුගල)
- චෙස් ( වයස අවු 15/17 න් පහළ) (තනි, යුගල)
- පිහිනුම් වයස අවු 10,12, 14, 16, 19 න් පහල
  (නිදහස් ආර, පසුපස ආර, ළය ආර, සමනළ ආර, මිශ්‍ර ආර)
- මලල ක්‍රීඩා

| | |
|---|---|
| වයස අවු 15 න් පහළ | මීටර 100,200,400<br>100X4, 200X4, |
| වයස අවු 17 න් පහළ | මීටර 100, 200, 400, 800, 1500<br>100X4, 200X4, 400X4<br>උස , දුර, යගුලිය, කවපෙත්ත, හෙල්ල |
| වයස අවු 19න් පහළ | මීටර 100, 200, 400, 800, 1500<br>100X4, 200X4, 400X4<br>උස , දුර, යගුලිය, කවපෙත්ත, හෙල්ල |
| මැරතන් (විවෘත) | |

<u>**වියදම් ඇස්තමේන්තුව**</u>

| අනු අංකය | විස්තරය | අපේක්ෂිත මුදල රුපියල් |
|---|---|---|
| 01 | සහතික පත්‍ර 600 | 30000.00 |

| | | |
|---|---|---|
| 02 | පදක්කම් 600 | 125000.00 |
| 03 | කුසලාන සඳහා වියදම | 55000.00 |
| 04 | ක්‍රිකට් සංවිධාන වියදම | 50000.00 |
| 05 | පාපන්දු සංවිධාන වියදම | 20000.00 |
| 06 | දැල් පන්දු සංවිධාන වියදම | 10000.00 |
| 07 | බැඩ්මින්ටන් සංවිධාන වියදම | 12000.00 |
| 08 | මේස පන්දු සංවිධාන වියදම | 12000.00 |
| 09 | වෙස් සංවිධාන වියදම | 12000.00 |
| 10 | පිහිනුම් සංවිධාන වියදම | 6000.00 |
| 11 | මලල ක්‍රීඩා සංවිධාන වියදම | 6000.00 |
| 12 | උත්සව දින වියදම (ප්‍රචාරණ,වේදිකා, සැරසිලි, සංග්‍රහ) | 60000.00 |
| 13 | අමතර වියදම් | 12000.00 |
| | **අපේක්ෂිත මුළු වියදම** | **410000.00** |

අනතුරුව එය අනුමත කරන බව ප්‍රyකාශ කරන ලදි. එමෙන්ම ක්‍රී1ඩා උත්සවය සඳහා ක්‍රී ඩා අමාත්‍යාතුමා හා පළාත් ක්‍රී ඩා අමාත්‍යyතුමා සහභාගී කරවා ගැනීමට උපරිම උත්සාහය ගතයුතු බවත් මාස දෙකක් ඇතුළත ක්‍රීරඩා උත්සවය නිම කිරීමට අවශ්‍යඩ කටයුතු සංවිධානය කරන ලෙසටද උපදෙස් ලබා දෙන ලදි.

පදක්කම් මිලදී ගැනීම සඳහා අනුග්‍රා හකත්වය ලබා ගැනීමට වෙළඳ සංගමයෙන් ඉල්ලීමක් කරන ලෙසටද යෝජනා විය.

**මහේන්ද්‍ර. වික්‍රාමසිංහ මහතා**

කලාප ක්‍රීඩා තරඟ ජුනි 17 වන දින ආරම්භ වන බවත් දුර පනින ස්ථානය සකස් කර දෙන ලෙස ඉල්ලා සිටින ලදි.

**තීරණය**

අදාල නිලධාරීන් දැනුවත් කර එම කටයුත්ත එදිනට පෙර ඉටු කර දෙන ලෙස

දන්වන ලදි.

**අදහස් හා යෝජනා**

**එල්.එස්. ද සිල්වා මයා**

මාදම්පා ගගේ ඇති පිහිනුම් තටාකයේ අත් වැල ගැලවී ඇති බවත් එය අළුත්වැඩියා කිරීමේ අවශ්‍යයතාවය පෙන්වා දෙන ලදි.

**මහේන්ද්‍රද වික්‍ර්මසිංහ මහතා**

ක්‍රීඩා පිටියේ පස් දමා ඇති නමුත් නියමිත පරිදි සකස් කර නොමැති බව ප්‍රතකාශ කරන ලදි.

**තීරණය**

අදාල අංශ දැනුවත් කර ක්‍රීසඩා පිටිය සකස් කරන ලෙස දැන්වීය

**මහේන්ද්‍ර වික්‍රරමසිංහ මහතා**

ක්‍රීඩා පිටිය වටා හෙලජන්ට් බල්බ් සවිකිරිම පිළිබඳ නැවත වරක් ඉල්ලිමක් කරන ලදි.

**තීරණය**

හෙලජන්ට් බල්බ් සඳහා ටෙන්ඩර් කර සභාවට ඉදිරිපත් කරනලෙස දන්වන ලදි.

**ගරු සභාපතිතුමා ,**

එම බල්බ සවිකිරීමෙන් පසු එහි වැය බර දරන්නේ අය කර ගන්නේ කෙසේද කියා විමසා සිටි අතර එය නගර සභාවට බරක් නොවන ලෙස අය උපයා ගත හැකි ක්රකමවේදයක් සකස් කර ගන්නා ලෙස දන්වන ලදි.

**ගරු නගර සභා මන්ත්රී අනුර කිත්සිරි මහතා**

අද දින සාකච්ඡා කරන ලද කරුණු හා යෝජනා ඊලග දිනයේදී සම්පූර්ණ වී තිබේ නම් එය අප නගරයේ දියුණුව බව ප්ර කාශ කර අතර ක්රිරඩා සමාජ නියෝජනය කරමින් පැමිණි නිලධාරින්, නගර සභාවේ නිලධාරීන් ඇතුළු පැමිණ සිටි සියළුම මහත්ම මහත්මීන්ට ස්තුතිය පල කරමින් කමිටුවේ කටයුතු අවසන් කරන ලදි.

සකස් කළේ - ඩබ්ලිව් .පී.සිල්වා මිය

සංවර්ධන සහකාර /ප්රජා සංවර්ධන නිලධාරී ( වැ.බ.)

ලේකම්,

අම්බලන්ගොඩ නගර සභාව

**ඒ අනුව 2013 -06- 11 දින පවත්වන ලද ක්‍රීඩා කමිටු වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**6: 4** **2013- 06- 20** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද පරිසර සෞඛ්‍ය හා සනීපාරක්‍ෂක කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

**<u>පරිසර සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුව</u>**

**<u>2013.06.20 ප.ව. 2.30</u>**

**<u>සහභාගීත්වය</u>**

| | |
|---|---|
| ❖ ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා | සභාපති, අම්බලන්ගොඩ නගර සභාව. |
| ❖ පී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා | නගර සභා මන්ත්‍රී අම්බලන්ගොඩ නගර සභාව |
| ❖ එච්.එල් අනුර කිත්සිරි මහතා | නගර සභා මන්ත්‍රී අම්බලන්ගොඩ නගර සභාව |
| ❖ වෛද්‍ය පී.ආර්.එන් ද සිල්වා මිය් | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීල අම්බලන්ගොඩ, |
| ❖ ඩී වී සුනිල් මහතා | ලේකම්, අම්බලන්ගොඩ නගර සභාව. |
| ❖ ඩබ්.පී සිල්වා මහත්මිය. | සංවර්ධන සහකාර, අම්බලන්ගොඩ නගර සභාව |
| ❖ පී. එච්. එල් සී පුෂ්පරාණි මහත්මිය | සංවර්ධන සහකාර, අම්බලන්ගොඩ නගර සභාව, |
| ❖ එම්.එච් නිහාල් රණසූරිය.මහතා. | පරිපාලක ම. සෞ. පරීක්‍ෂක, |
| ❖ එල් එච්.බී මංජුල මහතා. | ම. සෞ. පරීක්‍ෂක බරවා රෝග මර්ධන |
| ❖ පී. එස්. එස්. ද සිල්වා මහතා. | ම. සෞ. පරීක්‍ෂක, අම්බලන්ගොඩ නගර සභාව |
| ❖ කේ ශාන්ති මහත්මිය | ගොවිජන සංවර්ධන නිලධාරී. අම්බලන්ගොඩ. |
| ❖ යූ.ආර් වෛද්‍යනාථ මහතා. | පරිපාලන ග්‍රාම නිළධාරීල අම්බලන්ගොඩ. |
| ❖ පී.කුසුම් ද සිල්වා මහත්මිය | කළමණාකරණ සහකාර අම්. නගර සභාව |
| ❖ එම්.ඩබ් හිරාන් සංජීව මහතා | සෞඛ්‍ය පරිපාලක අම්බලන්ගොඩ නගර සභාව |

**පිළිගැනීම** :- **ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා**

සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුව සඳහා පැමිණි ගරු නගර සභා මන්ත්‍රී පී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා, ගරු නගර සභා මන්ත්‍රී එච්.එල් අනුර කිත්සිරි මහතා ද සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී තුමිය ඇතුළු සියළු නිලධාරී මහත්ම මහත්මීන් හා අනෙකුත් සියළුම රජයේ නිලධාරීනුත්, නගර සභා කාර්‍ය මණ්ඩලයත් ඉතාමත් ගෞරවයෙන් පිළිගනු ලබන බව පවසන ලදි. ඉන් අනතුරුව එළඹියේ පසුගිය රැස්වීමේ සාකච්ඡා වු කරුණු සමාලෝචනයක යෙදීමයි.

**මාර්ග සංවර්ධන අධිකාරිය සතු මාර්ගයන්හි කාණුවල ජලය නිසියාකාරව බැස යාම සඳහා කාණු ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ඇස්තමේන්තු සකස් කර සභා අනුමැතියෙන් අනතුරුව ඇමතිතුමාගේ අනුමැතියට යොමු කිරීම.**

**ගරු සභාපති ඇම් ඩබ් අරුණ ප්‍රදීප් මහතා**

ඉහත මාර්ගවල ඇස්තමේන්තු සකස් කර ඇති අතර ලබන සභාවට ඉදිරිපත් කරන බවත් ඒ සඳහා මුදල් වියදම් කිරීමට ඇමතිතුමාගේ අනුමැතිය ලැබුණහොත් එම කාර්‍ය ඉටුකරන බවත් ප්‍රකාශ කරන ලදි.

**ජගත් පරිසර දින වැඩසටහනෙහි ප්‍රගතිය.**

සංවර්ධන සහකාර පී.එච්.එල්.සී පුෂ්පරාණි මහත්මිය විසින් ලෝක පරිසර දිනය නිමිත්තෙන් සිදුකරන ලද වැඩසටහන් පිළිබඳ විස්තර කරන ලදි. 2013.06.05 දින පාසල් ළමුන් දැනුවත් කිරීම හා පළතුරු පැල බෙදාදීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කළ බවත්,2013.06.07 දින හල්වතුර ඇල පිරිසිදු කිරීමේ වැඩසටහනක් සිදු කළබවත්, 2013.06.08 දින නගර සභා බල ප්‍රදේශය ආවරණය වන පරිදි ඩෙංගු මර්ධන ශ්‍රමදාන වැඩසටහනක් පැවැත්වූ බවත්, එම වැඩසටහන් සාර්ථක කර ගැනීම සඳහා සහාය දුන් අම්බලන්ගොඩ නගර සභාවේ සියළුම කාර්‍ය මණ්ඩලයටත්,අම්බලන්ගොඩ පොලිස් ස්ථානය අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,අම්බලන්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය, කරන්දෙණිය යුධ හමුදා කඳවුර, ගාල්ල කිට විද්‍යා ඒකකය අම්බලන්ගොඩ ගොවිජන සේවා මධ්‍යස්ථානය යන ආයතනවල සියළු නිලධාරී මහත්ම මහත්මීන්ටත් ස්තුතිය පුද කරන බවත් ප්‍රකාශ කරන ලදි.

එමෙන්ම එම වැඩසටහන් සාර්ථක කර ගැනීම සඳහා පළතුරු පැල ලබාදුන් නැගෙනහිරු පදනමටත්,රු 14000.00 ක මුදල පරිත්‍යාග කළ වෙළඳ සංගමයටත්, දේශණ සඳහා සම්පත් දායකත්වය ලබාදුන් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ දිලිප් කුමාර මහතාටත් පළාත් පාලන අමාත්‍යංශයේ නිලධාරීන්ටත් ස්තුතිය පුද කරන බවත් ප්‍රකාශ කරන ලදි.

**ගරු සභාපති ඇම් ඩබ් අරුණ ප්‍රදීප් මහතා** .

මෙවැනි ඩෙංගු රෝග මර්දන ශ්‍රමදාන වැඩසටහනක් මාස තුනකට වරක්වත් පැවැත්වීම තුළින් යම් සේවාවක් ඉටු කළ හැකි බව පවසන ලදි. නිලධාරීන් සිදු කරන ලද සමීක්ෂණ වාර්තාවල තත්වය පිළිබඳ විමසන ලදි.

**ම. සෞ. පරීක්ෂක බරවා රෝග මර්ධන එල්.එච් මංජුල මහතා**

එම සමීක්ෂණ වාර්තා පරික්ෂා කළ බවත් ගැටළු සහිත ස්ථාන පරික්ෂා කර බලා අවශ්‍ය විසඳුම් ලබා දෙන බවත් ප්‍රකාශ කරන ලදි.

**ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා.**

මහජන සෞඛ්‍ය පරික්ෂක මහතුන් මෙම වැඩසටහනෙහි අඩුපාඩු පෙන්වා දුනහොත් ඉදිරියෙදි මෙවැනි වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදි වඩාත් සර්ථක ප්‍රතිඵල ලබා ගත හැකි බව ප්‍රකාශ කරන දි.

**ගරු සභාපති ඇම් ඩබ් අරුණ ප්‍රදීප් මහතා**

මෙම ශ්‍රමදාන වැඩසටහන සඳහා සහභාගී වු නිලධාරීන් ඇගයීමට ලක්කර ඔවුන්ගේ පෞද්ගලික ලිපිගොණුවට ලිපියක් දැමීම සුදුසු බවත්, ප්‍රකාශ කරන ලදි.

**පරිපාලන ග්‍රාම නිළධාරී යූ.ආර් වෛද්‍යනාථ මහතා.**

එසේ ලිපි යැවීමේදි පිටපත් දෙකකින් යැවීම සුදුසු බව ප්‍රකාශ කරන ලදි.

**ගරු සභාපති ඇම් ඩබ් අරුණ ප්‍රදීප් මහතා**

මෙම වැඩසටහනේදී කොන්ක්‍රීට් ස්ලැබ්වල ජලය රැඳෙන ස්ථාන හමුදා නිලධාරීන් ලවා පරීක්ෂා කිරීමට නොහැකි වූ බවත් ප්‍රකාශ කරන ලදී. ඊළඟ වැඩසටහන් සඳහා ගාල්ල මහ නගර සභාවේ ගිණි නිවන රථය ලබා ගැනීම සඳහා ඉල්ලීමක් කරන ලෙස උපදෙස් දෙන ලදී.

**.ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා.**

උස ගොඩනැගිලි සඳහා අනුමැතිය ලබාදීමේදී කොන්ක්‍රීට් තට්ටුව උඩ කසල වැනි දේ එකතුවීම සිදුවන නිසා ඒ පිළිබඳ සැලකිලිමත් වන ලෙසත්, සක්වා ගොඩනැගිල්ලේ උඩ මහලේ කසල විශාල ප්‍රමාණයක් එකතුවීම නිසා යම් අවස්ථාවකදී ගිණි ගැනීමක් සිදු විය හැකි බවත් ප්‍රකාශ කරන ලදී.

**ම. සෞ.පරීක්ෂක බරවා රෝග මර්ධන එල්.එච් මංජුල මහතා**

නගර සභාව මගින් මිලදී ගත් ධූමායන යන්ත්‍රය නිසා විශාල වැඩ කොටසක් සිදු කිරීමට හැකි වූ බව පවසන ලදී.

**ගරු සභාපති ඇම් ඩබ් අරුණ ප්‍රදීප් මහතා**

අපගේ සේවක මහතුන්ටත් ධූමායන කටයුතු පුහුණු කරන ලෙස පවසන ලදී.

**.ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා.**

රෝහලකින් රෝගියකු පිළිබඳ තොරතුරු වාර්තා වුවහොත් පමණක් ධූමායන කටයුතු සිදු කරන්නේ මන්දැයි විමසන ලදී.

**ම. සෞ. පරීක්ෂක බරවා රෝග මර්ධන එල්.එච් මංජුල මහතා**

ධූමායන කටයුතු දිගින් දිගටම සිදු කිරීම පරිසරයට හානිදායක විය හැකියි. සමනළුන්, කෘමීන් වැනි කුඩා සතුන් විනාශ විය හැකි නිසා නිතර නිතර ධූමායන කටයුතු සිදු නොකරන බව පෙන්වා දෙන ලදී.

**පරිපාලන ම.සෞ.පරීක්ෂක, එම්.එච් නිහාල් රණසූරිය. මහතා.**

පාසල් ළමුන් උපයෝගී කරගෙන ඩෙංගු මදුරුවන් බෝවන ස්ථාන පිළිබඳ සමීක්ෂණයක් සිදු කිරීම සඳහා සුදුසු ආකෘති පත්‍රයක් සම්පූර්ණ කිරීමට ලබාදීම තුළින් ඩෙංගු මදුරුවන් බෝවන ස්ථාන පිළිබඳ තොරතුරු බලා ගැනීමට හැකිවන බව පවසන ලදී.

**ගරු සභාපති ඇම් ඩබ් අරුණ ප්‍රදීප් මහතා**

එවැනි ආකෘති පත්‍ර 15000ක් පමණ අවශ්‍ය වන බැවින් එම ආකෘති පත්‍රය සකස් කර දුනහොත් එය ඉටු කර දිය හැකි බව පවසන ලදී. වැහිපීලිවල ජලය රැඳීම නිසා ඒ තුළ ඩෙංගු මදුරුවන් බෝවීමට හැකි බැවින් ළඟදීම වැහිපීලි ඉවත් කිරීම සඳහා චක්‍රලේඛයක් නිකුත් කරනු ඇතැයි ප්‍රකාශ කරන ලදී.

**ලැබී ඇති ලිපි සභාවට ඉදිරිපත් කිරීම**

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීතුමිය විසින් යොමු කරන ලද උපකරන ලබා ගැනීමේ ලිපිය කමිටුවට ඉදිරිපත් කරන ලද අතර එය සභාවට යොමු කර සාකච්ඡා කිරීමෙන් අනතුරුව තීරණයක් ගැනීමට කමිටුව තීරණය කරවන ලදී.

සුනඛ වන්ද්‍යාකරණයට අදාළ මිල ගණන් ඉදිරිපත් කිරීම මැයෙන් වෛද්‍ය නුවන් කුමාරසිංහ මහතා විසින් එවන ලද ලිපිය කමිටුවට ඉදිරිපත් කරන ලදී.

**ගරු සභාපති ඇම් ඩබ් අරුණ ප්‍රදීප් මහතා**

එම මිල ගණන් සැලකිල්ලට ගැනීමේදී එක් සුනකයකු වෙනුවෙන් වැයවන මුදල නිශ්චිතව දක්වා නොමැති බැවින් මෙම මිල ගණන් පිළිබඳ සෑහීමකට පත් විය නොහැකි බැවින් ගාල්ල සෞඛ්‍ය අමාත්‍යංශයේ ගෙවන ලද මිළ ගණන්වලට අදාලව ගෙවීමට කමිටුව තීරණය කරන ලදී. මේ සඳහා මහ ඇමති තුමාගේ අනුමැතිය ලබා ගත හැකි බවත් ඒ සඳහා වන මුදල ලබා දිය හැකි බව පැවසූ බවත් ප්‍රකාශ කරන ලදී.

**පරිපාලන ග්‍රාම නිළධාරී යූ.ආර් වෛද්‍යනාථ මහතා.**

නගරයේ ව්‍යාපාරික ස්ථාන"වලින් පිටවන අපිරිසිදු ජලය පිරිපහදු කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීම පිළිබඳ රැස්වීමක් 2013.06.28 දින පෙ.ව 9.00ට පැවැත්වෙන බවත් ඒ සඳහා සභාපතිතුමාට සහභාගී වන ලෙසත් පවසන ලදි.නගරයේ වෙළඳසැල් වලින් නිකුත් කරනු ලබන දිරාපත් නොවන බඩු බහාලන බෑග් නිසා පරිසරයට විශාල හානියක් සිදුවන බැවින් ඒවා පරිහරනය අවම කිරීම සඳහා සුදුසු වැඩපිළිවෙලක් යෙදීම පිළිබඳ අවධානය යොමු කරන ලෙස පවසන ලදි.

**වෙනත් කරුණු**

සුනඛයින් සඳහා ජලභීතිකා එන්නත් ලබා දීම සඳහා නිලධාරියකු පුහුණු කර ඒ තැනැත්තා සඳහා වැටුප් සභාවෙන් ගෙවීමටත්,එම මුදල සුනඛ අයිතිකරු වෙතින් අයකර ගැනිමට යම් වැඩපිළිවෙලක් යෙදීම සුදුසු බවත් පවසන ලදි.

**ගරු සභාපති ඇම් ඩබ් අරුණ ප්‍රදීප් මහතා**

එය අපට කළ හැකි බවත් ඒ පිළිබඳ ලිපියකින් දැනුවත් කිරීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදි. ම.සෞ.ප. ජයසේන මහතා විශ්‍රාම ගැනිමට නියමිත බැවින් ඔහුගේ වැඩ ආවරණය කිරීම සඳහා සෞ.වෛ.නි. කාර්යාලයේ නිලධාරියකු පත්කරන ලෙස පැවසිය. දැනට සෞ.වෛ.නි කාර්යාලයේ ම.සෞ. ප. මහතුන් කරන රාජකාරිවලට අමතරව ම.සෞ.පරික්ෂකගේ භූමිකාව වශයෙන් නියමිත අතිරේක රාජකාරි කොටසක් පවතින බවත් පවසන ලදි.

**ම. සෞ. පරීක්ෂක බරවා රෝග මර්ධන එල්.එච් මංජුල මහතා**

පසුගිය කාලයේ සෞඛ්‍ය අමාත්‍යංශය මගින් ම.සෞ.ප. මහතුන් බඳවා ගත් අතර බස්නාහිර පළාත් සභාවේ පළාත් පාලන ආයතනවලට අනුයුක්ත කර ඇති බවත් ප්‍රකාශ කරන ලදි.

අම්බලන්ගොඩ නගර සභාවේ ම.සෞ. ප. පුරප්පාඩුබ සඳහා නිලධාරියකු ඉල්ලා ලිපියක් යැවීමට ප්‍රධාන කළමණාකරණ සහකාර නිලධාරිනිය දැනුවත් කරන ලෙස.සභාපතිතා උපදෙස් දෙන ලදි.

**පරිපාලන ම. සෞ. පරීක්ෂක, එම්.එච් නිහාල් රණසූරිය. මහතා.**

හෙට දින කරන්දෙණියේ වීරකෝන් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන ඩෙංගු මර්ධන වැඩසටහන සඳහා ධූමායන යන්ත්‍රය ලබා දෙන ලෙස ඉල්ලීමක් කරන ලදි.

**ගරු සභාපති ඇම් ඩබ් අරුණ ප්‍රදීප් මහතා**

බලපිටිය හා ඇල්පිටිය ප්‍රාදේශිය සභාවල සභාපතිවරු ඉල්ලීම් කල බවත් හවැනි අවස්ථාවලදි ලබා දීමට සිදුවන බවත්, මෙම යන්ත්‍රය නිනර නිතර භාවිතා කිරීම නිසා ඉක්මණින් අබලන් විය හැකි බැවින් අනෙකුත් සභාවලටත් මෙම යන්ත්‍රය මිලදි ගැනිම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදි. මහ ඇමතිතුමා ධූමායන යන්ත්‍රයක් ලබා දෙන බවට පොරොන්දු වූ බවත් ඉල්ලීමක් කළහොත් ලබා ගත හැකි බවත් ප්‍රකාශ කරන ලදි.

**සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී, වෛද්‍ය පී.ආර්.එන් ද සිල්වා මිය,**

මෙවැනි ශ්‍රමදාන වැඩසටහන් වරින් වර ක්‍රියාත්මක කිරීම සුදුසු බවත්, නිවෙස් පරික්ෂා කිරීමට පැමිණෙන බව දන්වා ශබ්ද විකාශන යන්ත්‍ර මගින් දැනුවත් කිරීම සුදුසු බවත්, ජනතාව මේ පිළිවද අවධානය යොමු කිරීම තුළින් යම් ප්‍රමාණයකට නිවෙස් පිරිසිදුව තබා ගත හැකි බවත් ප්‍රකාශ කරන ලදි.

**<u>ස්තුති කථාව</u>**

**නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා.**

නගරයේ සෞඛ්‍ය අංශයේ දියුණුව උදෙසා සෞ.වෛ.නි. කාර්යාලයේ නිලධාරීන් ගන්නා වූ උත්සාහය සම්බන්ධයෙන් නගරයේ ජනතාව වෙනුවෙන් ස්තුතිය පුද කරන බවත් අද දින රැස්වීම සඳහා සහභාගී වූ වෛද්‍ය පී.ආර්.එන් ද සිල්වා මිය ඇතුළු නිලධාරී මහත්ම මහත්මින්ටත්, අනෙකුත් රජයේ නිලධාරීන් සියළු දෙනාටත් ස්තුතිය පුද කරන බව ප්‍රකාශ කරන ලදී.

ප.ව.4.15 ට පමණ රැස්වීමේ කටයුතු නිම කරන ලදී.

සකස් කළේ :

පී.එච්.එල්.සී.පුෂ්පරාණි.
සංවර්ධන සහකාර (සැලසුම්)

ලේකම්
ඩී.වී.සුනිල්
අම්බලන්ගොඩ නගර සභාව

**ඒ අනුව 2013 -06- 20 දින පවත්වන ලද පරිසර සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**6: 5** **2013- 06- 25** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද පුස්තකාල කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.

**<u>2013 ජුනි මස 25 වැනි දින ප.ව. 2.30 ට පැවැත් වූ පුස්තකාල කමිටු වාර්තාව</u>**

| | |
|---|---|
| 01. ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා | ගරු සභාපති |
| 02. ඩි.ඩබ්. සුනිල් මහතා | ලේකම් |
| 03. ඩබ්.පී. සිල්වා මිය | ප්‍රජා සංවර්ධන නිලධාරී |
| 04. කේ.එච්. මෙලානි මධුෂා මිය | පුස්තකාලයාධිපතිනි |
| 05. ටී. නදීකා නිල්මිණි මෙනවිය | සංවර්ධන නිලධාරී |
| 06. හර්බට් වීරක්කොඩි මහතා | කමිටු සාමාජික |
| 07. පිනේන්ද්‍රවංශ ද සිල්වා මහතා | කමිටු සාමාජික |
| 08. ටී.ඩබ්. හරිස්චන්ද්‍ර මහතා | කමිටු සාමාජික |
| 09. සිරිපාල මාදුවගේ මහතා | කමිටු සාමාජික |
| 10. පී.ඩබ්. ගුණසිරි මහතා | කමිටු සාමාජික |
| 11. පී.එච්.එල්. පියන්ති මෙනවිය | පුස්තකාල සහායිකා |
| 12. ජී.ඩබ්. ඉන්ද්‍රදාස මහතා | පුස්තකාල සහායක |
| 13. එම්.ඩබ්.ජේ. සුමංගලි මිය | පුස්තකාල සහායිකා |
| 14. කේ.ජී. විසුද්ධි රේණුකා මිය | පුස්තකාල සහායික |
| 15. ගෞරී වරුෂවිතාන මිය | පුස්තකාල සහායිකා |

16.ජ්.පී. ලක්ෂ්මි පෙරේරා මෙනවිය පුස්තකාල සහායිකා

17. මාලති අරියසිංහ මිය පුස්තකාල සහායිකා

**<u>මුලාසනය</u>**

ගරු සභාපතිතුමා ස්වේච්ඡාවෙන් කමිටුවට පැමිණි සියළුම කමිටු සාමාජික මහතුන්,ප්‍රජා සංවර්ධන නිලධාරිනි,පුස්තකාලයාධිපතිනිය ඇතුළු පුස්තකාල කාර්ය මණ්ඩලය පිළිගැනීමෙන් කමිටුවේ වැඩ ආරම්භ කරන ලදී.

2013.05.20 කමිටු වාර්තාවේ සංශෝධන

1. කමිටු සාමාජික යූ.ඩබ්. ඥාණසිරි මහතා විසින් පුස්තකාලයට පරිත්‍යාග කල පොත් තුනෙන් එක පොතක නම වැරදි ලෙස සඳහන් වී ඇති බැවින් එම පොතෙහි නම Pictorial Biography of Skyamuni Buddha ලෙස නිවැරදි විය යුතුය.

2. ශාඛා පුස්තකාල සඳහා සුවි කැබිනට්ටු අවශ්‍ය බවට ප්‍රකාශ කර සිටියේ ගෞරි මහත්මිය බවට වැරදීමකින් වාර්තාවේ සඳහන් වී ඇත. එය නිවැරදි විය යුත්තේ පුස්තකාලධිපතිනිය විසින් ප්‍රකාශ කර බවටය.

01. පුස්තකාල ප්‍රගති වාර්තාව කමිටුවට ඉදිරිපත් කිරීම

ප්‍රධාන පුස්තකාලයේ ප්‍රගති වාර්තාව පුස්තකාලයාධිපතිනිය විසින් ද, අනිකුත් ශාඛා පුස්තකාල වල ප්‍රගති වාර්තා ඒ ඒ ශාඛා භාර නිලධාරින් විසින් ඉදිරිපත් කරන ලදී. මහ අම්බලන්ගොඩ ශාඛා පුස්තකාලයේ ප්‍රගති වාර්තාව පී.එච්.එල්. පියන්ති මෙනවිය විසින් ද, කෙරමිණිය ශාඛා පුස්තකාලයේ ප්‍රගති වාර්තාව ජ්.ඩබ්. ඉළුදාස මහතා විසින් ද ඉදිරිපත් කරන ලදී.

02. ගරු සභාපති තුමා විසින් පොත් බැහැර දීමේ ප්‍රස්ථාරය බැලීමෙන් පසු පෝරඹ ශාඛා පුස්තකාලයේ පොත් බැහැර දීම අඩු වීමට හේතුව එම ශාඛාව භාර ලක්ෂ්මි මෙනවියගෙන් කරුණු විමසන ලදී. එහිදී එම නිලධාරිනිය ප්‍රකාශ කළේ සාමාජිකත්වය අලුත් නොකර තිබූ බැවින් සාමාජිකයන් නොසිටි බවත්, තමා පෝරඹ ශාඛා පුස්තකාලයේ වැඩ භාරගත් පසු අලුතින් සාමාජිකයන් බඳවා ගත් බවත්ය. පොල්වත්ත පුස්තකාලයේ පොත් බැහැර දීම ඉතා දියුණු මට්ටමක පවතින බැව් පෙනී යන නිසා දියුණු වන පුස්තකාලයක් වශයෙන් නව පොත් ලබා දීමේදී එම පුස්තකාලයට ලබා දිය යුතු බව සභාපති තුමා පවසන ලදී. පොල්වත්ත ශාඛාවේ සේවය කරන සහායිකාව කථා කරමින් කියා සිටියේ අලුතින් පොත් ලැබුණු පසු තබා ගැනීමට කබඩ් සහ ඉඩ පහසුකම් ප්‍රමාණවත් නොවන බවයි.

තිරණය

පොල්වත්ත බුද්ධ දත්ත විදුහල ඉදිරිපිට පාරේ වම්පස ඇති ගොඩනැගිල්ල අලුත් වැඩියා කර එම ස්ථානයට පුස්තකාලය රැගෙන යාමට අවශ්‍ය කටයුතු සලස්වන ලෙස ලේකම් තුමාට සභාපති තුමා විසින් උපදෙස් දෙන ලදී.

03. පිනේඳවංශ මහතා කථා කරමින් පොත් බැහැර දීමේ ප්‍රස්ථාරය ඇඳීමේදී කාලය හා කොල අපතේ නොයවා එක කොලයකට ඇඳිය හැකි බව පෙන්වා දීම එතුමා රැගෙනා ආ ප්‍රස්ථාරය කමිටුවට ඉදිරිපත් කළේය.

04. ශාඛා පුස්තකාල වල පාඨක සමාජ මගින් තරග පවත්වා ළමුන්ට ත්‍යාගයක් ලබා දීමට කටයුතු කරන ලෙස ශාඛා භාර සහායිකාවන්ට සභාපති තුමා උපදෙස් දෙන ලදී.

05. ජාතික කියවීමේ මාසය වෙනුවෙන් පැවැත්වීමට නියමිත තරග පිළබඳ විස්තරයත්, වැය ඇස්තමේන්තු වාර්තාවත් පුස්තකාලයාධිපතිනිය විසින් කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී. පැවැත්වීමට නියමිත තරග වල යම්කිසි වෙනස් කම් සිදු කිරීමට අවශ්‍ය නම් වෙනස් කිරීම සඳහා සභාපති තුමා එම වාර්තාව කමිටු සාමාජික මහතුන් වෙත ඉදිරිපත් කරන ලදී. කමිටු සාමාජික මහතුන් විසින් එම විස්තර පත්‍රිකාව කියවා බලා අවශ්‍ය සංශෝධන සිදු කරන ලදී. ඒ අනුව 1 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා නියමිත චිත්‍ර තරගය කොටස් දෙකකට පැවැත්වීමට සුදුසු බවත්, එමෙන්ම 1 ශ්‍රේණියේ සිට 3 ශ්‍රේණිය

දක්වා එක කණ්ඩායමකුත් 4,5 ශ්‍රේණි එක කණ්ඩායමකුත් වශයෙන් පැවැත්විය යුතු බවත් ප්‍රකාශ කරන ලදි. නැතහොත් ළමුන්ට අසාධාරණයක් සිදුවන බව ඔවුන් පෙන්වා දෙන ලදි.

කියවීමේ මාසයේ උත්සවයේ ප්‍රධාන දේශකයා වශයෙන් කවුරුන් ගෙන්වන්නේද යන්න ඊළඟ මාතෘකාව විය. පිනේඑවංශ මහතා ප්‍රකාශ කළේ සුනන්ද මහේඑ මහතා ගෙන්වීමට පුළුවන්නම් හොඳ බවයි. එහිදී සභාපති තුමා ප්‍රකාශ කළේ ජයලත් මනෝරත්න මහතා ගෙන්වා ගැනීමට හැකිනම් එය ඉතා වටිනා බවත් ඔහුගෙන් ළමයින්ට හොඳ දැනුමක් ලබා ගත හැකි බවත්ය.

තිරණය

කියවීමේ මාසයේ උත්සවයේදී ප්‍රධාන දේශකයා වශයෙන් ජයලත් මනෝරත්න මහතා ගෙන්වීමට තිරණය විය.

පොත් සාමාගම් වලින් හා බැංකු වලින් ළමයින්ට ත්‍යාග ලබා දීම සඳහා අනුග්‍රහය ලබා ගැනිමට කටයුතු කරන ලෙස ප්‍රජා සංවර්ධන නිලධාරි තුමියට සභාපති තුමා පවසන ලදි.

කියවීමේ මාසයේ උත්සවය පවත්වන දිනම ෑ බසඉර්රහ එක විවෘත කිරීමට යොදා ගැනීමට හැකි නම් එය වඩා හොඳ බව සභාපති තුමා විසින් පවසන ලදි. ෑ බසඉර්රහ එක සඳහා පරිගණක කියක් අවශ්‍ය දැයි සභාපති තුමා පුස්තකාලයාධිපතිනියගෙන් විමසන ලදි. එහිදී පරිගණක දහයක් පමණ අවශ්‍ය බව එතුමිය ප්‍රකාශ කලේය.

තිරණය

අවශ්‍ය පරිගණක ප්‍රමාණය මහ ඇමති තුමාගෙන් ලබා ගැනිම සඳහා ලිපියක් සකස් කර යවන ලෙස සභාපති තුමා විසින් ප්‍රජා සංවර්ධන නිලධාරි තුමියට පවසන ලදි.

ත්‍යාග වශයෙන් ලබා දීමට සංස්කෘතික අමාත්‍යාංශයෙන් පොත් ලබා ගත හැකි බව ලේකම් තුමා විසින් පැවසීය. බලංගොඩ ෑ බසඉර්රහ එකෙන් ලබාගත් දැනුම පාඨකයින්ට ප්‍රයෝජනවත් ආකාරයට ලබා දීමට කටයුතු කරන මෙන් සභාපති තුමා පැවසීය. බලංගොඩ ෑ බසඉර්රහ එකේ ෂබඑැරබැඑ සඳහා රු.60/- ක මුදලක් පාඨකයින්ගෙන් ලබා ගන්නා බව පුස්තකාල සහායිකාවන් පවසන ලදි. ඒ අනුව අපගේ ෑ බසඉර්රහ එකෙන් ෂබඑැරබැඑ සඳහා රු.60/- මුදලක් ලබා ගෙන පාඨකයින්ට සේවයක් සැපයීමට කටයුතු කරන ලෙස සභාපති තුමා පුස්තකාල කාර්ය මණ්ඩලය දැනුවත් කරන ලදි.

පුස්තකාල සේවා මණ්ඩලයේ දින 3 පරිගණක පුහුණුව සහායිකාවන්ට ලබා දීමට කටයුතු කරන ලෙස ප්‍රජා සංවර්ධන නිලධාරි තුමියට සභාපති තුමා විසින් පවසන ලදි. මූලික පරිගණක දැනුම නැති සහායිකාවන් සිටින බැවින් ප්‍රථමයෙන් ඔවුන්ට මූලික පරිගණක දැනුම ලබා දීමට  කටයුතු ලෙස ලේකම් තුමාට උපදෙස් දෙන ලදි.

තිරණය

අම්බලන්ගොඩ නැණසල ආයතනයෙන් හෝ විවෘත විශ්ව විද්‍යාලයෙන් එම පුහුණුව ලබා දිමට කටයුතු කිරීම.

අවු. 10 ක් පුස්තකාල සහායිකා වශයෙන් සේවය කරන උසස් පෙළ නොමැති නිලධාරින්ට පුස්තකාල විද්‍යාව හැදැරීමට හැකි බව පුස්තකාලයාධිපතිනිය විසින් පවසන ලදි. එතුමිය කැළණිය විශ්ව විද්‍යාලයෙන් විස්තර අසා දැනගත් බව සඳහන් කළේය. එය ඉතා හොඳ දෙයක් බැවි සභාපති තුමා පවසා සිටින ලදි. පාඨමාලාව සඳහා ලබන ජනවාරි මස ඉල්ලුම් කල හැකි බව පුස්තකාලයාධිපතිනිය කරුණු දැක්විය.

ඕකන්ද ශාඛා පුස්තකාලයට රාවය පුවත්පත වෙනුවට රිවිර පුවත්පත ලබා ගැනීම සඳහා පාඨකයින්ගෙන් සමීක්ෂණයක් කළ බවද, එහිදී වැඩි පාඨක පිරිස රිවිර පුවත්පත ඉල්ලු බවද මාලති මහත්මිය විසින් සභාපති තුමාට පවසන ලදි.

තිරණය

ඕකන්ද පුස්තකාලයට රාවය පුවත්පත වෙනුවට රිවිර පුවත්පත ලබා ගන්නා ලෙස සභාපති තුමා පවසන ලදි.

හෙප්පුමුල්ල ශාඛා පුස්තකාලයේ සිවිලිමේ පිටත කොටසේ වැඩ අවසන් කර නොමැති බැවින් එය පිටතට අවලස්සන ලෙස පෙනෙන බව සභාපති තුමා පවසන ලදි. එහිදී ශාඛා භාර නිලධාරිනිය ප්‍රකාශ කළේ ඇස්තමේන්තුව ඉදිරිපත් කර ඇත්තේ පුස්තකාලයේ ඇතුලත කොටසට බවත්ය. ඊට පසුව අදාල නිලධාරින් පැමිණ පිටතට නව ඇස්තමේන්තුවක් සැකසු බවත්ය.

තිරණය

හැකි ඉක්මනින් හෙප්පුමුල්ල ශාඛා පුස්තකාලයේ වහලයේ පිටත කොටසේ වැඩ අවසන් කරවා ගන්නා ලෙස සභාපති තුමා පවසන ලදි.

ලේකම් මහතා විසින් ඩෙංගු මර්ධන වැඩසටහනට සහභාගි වු කමිටු සාමාජික මහතුන්ට ස්තුතිය ප්‍රකාශ කරන ලදි.

ප්‍රධාන හා ශාඛා පුස්තකාල වල පාඨක අදහස් පොත් සභාපති තුමා විසින් පරික්ෂා කරන ලදි. මහ අම්බලන්ගොඩ ශාඛා පුස්තකාලයේ පාඨකයකු විසින් සිංහල ව්‍යාකරණ පොත් ඉල්ලා ඇති බවත් අවශ්‍ය පොත් මොනවාද යන්න පාඨකයාගෙන් විමසා එම පුස්තකාලයට පොත් ලබා දීමට කටයුතු කරන මෙන් සභාපති තුමා පුස්තකාලාධිපතිට උපදෙස් දෙන ලදි.

ගරු සභාපති තුමා ස්තුති කථාව කිරීමට ප්‍රජා සංවර්ධන නිලධාරි තුමියට ආරාධනා කලේය. එතුමි ස්වේජාවෙන් කමිටුවට පැමිණි සියලුම කමිටු සාමාජික මහතුන්ටත්, සභාපති තුමාටත්, ලේකම්තුමාටත්, පුස්තකාලයාධිපතිනිය ඇතුළු පුස්තකාල කාර්ය මණ්ඩලයට ස්තුති කරමින් කමිටුවේ වැඩ අවසන් කරන ලදි.

....................................

කමිටු ලේකම්
නගර සභාව අම්බලන්ගොඩ.

| | |
|---|---|
| .................................... | .................................... |
| ලේකම් | අත්සන් කළේ සභාපති |
| නගර සභාව අම්බලන්ගොඩ | නගර සභාව අම්බලන්ගොඩ |

**ඒ අනුව 2013 -06-25 දින පවත්වන ලද පුස්තකාල කමිටු වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

## (07) ටෙන්ඩර් හා මිල ගණන්

**7:1** **ටෙන්ඩර්** :- නැත

**7:2** **මිල ගණන්** :-

**7:2:1** ටියුබ් සඳහා මිළ ගණන් කැදවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් සලකුණු කර ඇති මිල ගණන් පිලිගැනීමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | සුමිත් මාර්කටින් | ආසිරි ටයර් සර්විස් | |
|---|---|---|---|---|---|
| 01 | 600 X 16 ටියුබ් | | **1200/-** | 1350/- | |
| 02 | 825 X 16 ටියුබ් | | **2050/-** | 2140/- | |
| 03 | 600 X 12 ටියුබ් | | **740/-** | 750/- | |
| 04 | 11 X 28 ටියුබ් | | 4470/- | **4000/-** | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 05 | 750 X 16 ටියුබ් | | **1800/-** | 1880/- | |
| 06 | 600 X 14 ටියුබ් | | **880/-** | 1200/- | |
| 07 | 400 X 8 ටියුබ් | | **580/-** | 590/- | |
| 08 | 185 X 16 ටියුබ් | | **880/-** | 1200/- | |
| 09 | 500 X 12 ටියුබ් | | **740/-** | 750/- | |
| 10 | 750 X 16 රිම් ටේප් | | 480/- | - | |

**7:2:2** මහජන ක්‍රීඩාංගණය මැනීම (ධාවන පථය) සඳහා මිළ ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරීගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන පිලිගැනීමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | කපිල නයිදුවාවඩු | |
|---|---|---|---|---|
| 01 | අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගණයේ ධාවන පථය මැන ලකුණු කිරීම | | **12000/-** | |
| | | | | |

**7:2:3** ටයර් සඳහා මිල ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරීගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනීමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | **Sumith Marketing** | **Asiri Tyre** | |
|---|---|---|---|---|---|
| 01 | 600 X 16 ටයර් | | 11108/- | **10620/-** | |
| 02 | 825 X 16 ටයර් | | **24304/-** | 25675/- | |
| 03 | 600 X 12 ටයර් | | **7466/-** | 7535/- | |
| 04 | 11 X 28 ටයර් | | 42975/- | **41420/-** | |
| 05 | 750 X 16 ටයර් | | **17390/-** | 18370/- | |
| 06 | 600 X 14 ටයර් | | **7491/-** | 7915/- | |
| 07 | 400 X 8 ටයර් | | 2665/- | **2500/-** | |
| 08 | 185 X 14 ටයර් | | **9051/-** | 9560/- | |
| 09 | 500 X 12 ටයර් | | **5632/-** | 5685/- | |
| 10 | 600 X 16 ටයර් | | **10521/-** | - | |
| 11 | 11 X 28 ටයර් | | **41042/-** | - | |

**7:2:4** විදුලි පංකා සඳහා මිල ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරීගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිළ ගණන් පිලිගැනීමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | Abans show Room | Dishan & Dishani | Singer srilanka |
|---|---|---|---|---|---|
| 01 | Stand fan | | 5900/- (Airmat) | **4700/-** (Rikon) | 8837/- (Singer) |
| | | | 6900/- (Mitsubishi) | **6200/-** (Mira) | 5% Discount |
| | | | 10400/- (Airmat) | **6900/-** (Crown) | |
| | | | **3900/-** (Electrique) | - | |
| 02 | Ceiling Fan | | 5500/- | 3800/- (Usha) | 6637/- KDK |
| | | | | **3600/-** Linda | |
| | | | | 6100/- KDK | 5% Discount |
| | | | | 5900/- KDK | |
| 03 | Table Fan | | 4900/- | 4200/- (Mira) | **4137/-** (Singer) |
| | | | | | 5% Discount |

**7:2:5** රූපවාහිනී යන්ත්‍ර සඳහා මිළ ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනීමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | Abans show Room | Dishan & Dishani | Softlogic Show Room |
|---|---|---|---|---|---|
| 01 | රූපවාහිනී යන්ත්‍ර | | 64990/- (LG- LED) | 62990/- (Samsung) | 36900/- (Samsung) |
| | | | 64990/- (Toshiba LED) | 44900/- (Innovex) | 39900/- (Panasonic) |
| | | | | 45900/- (Videocon) | |

**7:2:6** ට්‍රැක්ටර් අමතර කොටස් සඳහා මිළ ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් සලකුණු කර ඇති මිල ගණන් පිලිගැනීමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | රත්න මෝටර්ස් ප්‍ර. ලිමිටඩ් | එම්. සෙනෙවිරත්න ප්‍ර. ලිමිටඩ් | ධනුෂ්ක මෝටර් ස්ටෝර්ස් |
|---|---|---|---|---|---|
| 01 | හිච් ප්ලේට් | 01 | **2300/-** | 2500/- | 2450/- |
| 02 | හයිඩ්‍රොලික් පොම්ප | 01 | **20000/-** | 21000/- | 22500/- |
| 03 | 750 X 16 රිම් | 01 | **6750/-** | 6950/- | 7600/- |

**7:2:7** ලෙදර් විකට් කුරු සෙට් සඳහා මිළ ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනීමට සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | ගිත්මි ස්පෝර්ට්ස් | පීඩීඑම් ස්පෝර්ට්ස් | කාවින්දි ස්පෝර්ට්ස් |
|---|---|---|---|---|---|
| 01 | ලෙදර් විකට් කුරු සෙට් | 01 | **1800/-** | 1900/- | 1890/- |
| | | | | | |

**7:2:8** ට්‍රැක්ටර් අමතර කොටස් සඳහා මිළ ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් සලකුණු කර ඇති මිල ගණන් පිලිගැනීමට සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | රත්න මෝටර්ස් ප්‍ර. ලිමිටඩ් | එම්. සෙනෙවිරත්න ප්‍ර. ලිමිටඩ් | ධනුෂ්ක මෝටර් ස්ටෝර්ස් |
|---|---|---|---|---|---|
| 01 | ස්ටාටර් මෝටර් | England<br>Indian | **27500/-**<br>20500/- | 29000/-<br>England | 29250/-<br>England |
| 02 | ඕල්ටනේටර් | England<br>Indian | **14000/-**<br>9000/- | 15000/-<br>England | 15750/-<br>England |
| 03 | හෙඩ් ලයිට් සෙට් | | **2300/-** | 2500/- | 3200/- |
| 04 | ඉදිරි වැල් | | **4950/-** | 5100/- | 5400/- |
| 05 | බ්‍රේක් ලයිනර් සෙට් | | **975/-** | 1050/- | 1200/- |
| 06 | ෆෑන් බෙල්ට් | | **575/-** | 680/- | 750/- |
| 07 | ඔයිල් බාත් එයාර් ක්ලිනර් | | **5950/-** | 6100/- | 6300/- |
| 08 | ස්පීඩෝ මීටර් | | **5200/-** | 5350/- | 5900/- |
| 09 | ස්පීඩෝ මීටර් කේබල් | | **1600/-** | 1800/- | 1800/- |
| 10 | රේඩියේටර් | Turkey<br>Indian | 31000/-<br>**26000/-** | 35000/-<br>Turkey | 32500/-<br>Turkey |
| 11 | හිච් සෙට් | | **24500/-** | 26000/- | 26000/- |

**(08)** ගෙවීම්

8. 1 ඇ. අංක 0493 යටතේ ලබා ගත් Torner සඳහා ගාලු පාර, අම්බලන්ගොඩ, එල්. එස්. ජේ. කම්පියුටර්ස් හි ඩබ්. එල්. එස්. ජයවර්ධන වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි, රු. 12750/- ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා ගැනීම.

Torner 12750/- X 1 - 12750.00

8.2 ඇ. අංක 0603 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද Gas වෙනුවෙන් මහ අම්බලන්ගොඩ , අම්බලන්ගොඩ, එම්. පී. ද සිල්වා මයා වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 57920/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා ගැනීම.

Gas 7240/- X 8 - 57920.00

8.3 ඇ. අංක 0608 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද පුස්තකාල කාඩ්පත් වෙනුවෙන් කුලරත්න පාර, සක්වා ප්‍රින්ටර්ස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 17000/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා ගැනීම.

සුචි කාඩ්පත් 0.85 X 20000 - 17000.00

8. 4 ඇ. අංක 0607 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද වානේ අල්මාරි වෙනුවෙන් අම්බලන්ගොඩ, ගාලු පාර, පත්මා ෆර්නිචර් මහතා වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 10500/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා ගැනීම.

Steel Cupboard 10500/- X 1 - 10500.00

8.5 ඇ. අංක 0490 යටතේ කාර්යාලයට ලබා ගත් ලාච්චු සහිත වානේ කැබිනට් වෙනුවෙන් අම්බලන්ගොඩ, මහ පන්සල පාර, ඩයමන්ඩ් බ්‍රදර්ස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 10850/- ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා ගැනීම.

Steel Cupboard 10850/- X 1 - 10850.00

8.6 නගර සභාව සතු GL-9369 අංක දරණ ගලි බවුසරය සඳහා 2013 මැයි මස 01- 15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 13563.20 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සි/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 3965 | ඩීසල් | 112 |

8.7 නගර සභාව සතු LF-1853 අංක දරණ ටිපර් රථය සඳහා 2013 මැයි මස 01- 15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 22161.30 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සි/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 3953 | ඩීසල් | 74 |
| 3956 | ඩීසල් | 44 |
| 3964 | ඩීසල් | 65 |

8.8 නගර සභාව සතු RA-3709 අංක දරණ ට්‍රැක්ටරය සඳහා 2013 මැයි මස 01- 15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 11553.90 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සි/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 3958 | ඩීසල් | 44 |
| 3974 | ඩීසල් | 45 |
| | හයිඩ්‍රොලික් ඔයිල් | 02 |

8.9 නගර සභාව සතු 252 - 0730 අංක දරණ කැබ්රථය සඳහා 2013 මැයි මස 01- 15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 26737.00 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | | ප්‍රමාණය ලීටර් |
|---|---|---|---|
| 3951 | ඩීසල් | | 30 |
| 3963 | ඩීසල් | | 61 |
| 3968 | ඩීසල් | | 70 |
| 3977 | ඩීසල් | | 59 |
| | Air freshner | කැට | 01 |

8.10 නගර සභාව සතු RA-3709 අංක දරණ ට්‍රැක්ටරය සඳහා 2013 මැයි මස 15-31 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 15379.70 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 3981 | ඩීසල් | 43 |
| 3995 | ඩීසල් | 42 |
| 4009 | ඩීසල් | 42 |

8.11 නගර සභාව සතු RA-8796 අංක දරණ ට්‍රැක්ටරය සඳහා 2013 මැයි මස 15-31 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 13078.80 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 3982 | ඩීසල් | 35 |
| 3996 | ඩීසල් | 35 |
| 4010 | ඩීසල් | 38 |

8.12 නගර සභාව සතු GL- 9369 අංක දරණ ගලි බවුසරය සඳහා 2013 මැයි මස 15-31 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 20231.80 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 3989 | ඩීසල් | 148 |
| | එන්ජින් ඔයිල් | 05 |

8.13 නගර සභාව සතු 252 - 0730 අංක දරණ කැබ්රථය සඳහා 2013 මැයි මස 15- 31 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 28821.80 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරී ගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 3990 | ඩීසල් | 51 |
| 4000 | ඩීසල් | 48 |
| 4005 | ඩීසල් | 35 |
| 4006 | ඩීසල් | 48 |
| 4013 | ඩීසල් | 56 |

8.14 හල්වතුර කසල අවසාන බැහැරලන ස්ථානයේ කසල තුනී කිරීම වෙනුවෙන් විස්කම් කොන්ක්‍රීට් වර්ක්ස් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය වෙත රු. 127250.00 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.15 පීරිස් වෙද මාවත හා කුලරත්න හරස්පාරට සමාන්තරව පිහිටි ඇළ මාර්ගය පිරිසිදු කිරීම වෙනුවෙන් දීපිකා කන්ස්ට්‍රක්ෂන් ආයතනය වෙත රු. 22890.00 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:16 2013 අප්‍රේල් මාසයට අදාල දුරකතන බිල්පත සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට හා ඩයලොග් ආයතනයට ගෙවීම.

| වැය අංකය | ගෙවූ මුදල |
|---|---|
| 11452 | 46150.77 |
| 12452 | 1163.28 |
| 25451 II | 2755.69 |
| 62452 I | 4026.91 |
| | **54096.65** |

දුරකතන බිල්පත සඳහා රු: **54096.65** ක මුදලක් චෙක්පතකින් ලේකම් නිර්දේශයෙන් ගෙවීම.

8.17 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පුහුණු පාඨමාලාව හැදෑරීම වෙනුවෙන් රු. 17500.00 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි සභාපති, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

ඉදිරියේදී අපේ පුස්තකාලය ඉතාමත් දියුණු තත්වයකට ගේන්න බලාපොරොත්තු වෙනවා. ඒ නිසා පරිගණක දැනුම නොමැති සේවකයන් සඳහා අවශ්‍ය පුහුණුවීම් ලබා දීමට කටයුතු කරනවා. ඒවගේම ඉඩකඩ සීමා කර ගැනීම සඳහා පැරණි පොත් CD බවට පත් කරනවා. තමන්ගේ නිවසේ ඉඳගෙනම ප්‍රධාන පුස්තකාලයේ තිබෙන පොත් පත් කියවීමේ හැකියාවක් ඉදිරියේදී ඇති කරනවා.

ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්

සභාපතිතුමනි අපගේ තිබෙන වට්නා කියන ලිපි ලේඛන ස්කෑන් කිරීම හරහා සංරක්ෂිත කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. ඒවගේම මම ඉල්ලා සිටිනවා අපේ සේවක මණ්ඩලය වගේම මන්ත්‍රී මණ්ඩලයටත් මේ පුහුණුවීම් ලබා දීමට කටයුතු කරනව නම් හොඳයි කියලා. ඊට අමතරව සභාපතිතුමනි පළාත් පාලන ආයතන කීපයක අයිපෑඩ් ලබා දීල තියෙනව මන්ත්‍රීවරුන්ට. අනුරාධපුර, කඩුවෙල, හෝමාගම යන නගර සභා වල ලබල දීල තියෙනවා. ඒ අවස්ථාව අපේ සහෝදර මන්ත්‍රීවරුන්ටත් ලැබෙනව නම් හොඳයි කියල මම විශ්වාස කරනවා. අයි පෑඩ් එකක මිල ලක්ෂයක් පමණ වුනත් රු. 48000/- ක් වගේ මුදලකට ලබා දීල තියෙනවා. මේ බදු සහනය යටතේ මෙය ලබා ගන්නවා නම් තවත් අඩු මුදලකට ලබා ගන්න හැකියාවක් ලැබේවි කියල මම විශ්වාස කරනවා.

ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

ලේකම් මහතා අනුරාධපුර නගර සභාවෙන් ඒ ගැන විමසීමක් කරල බලන්න. ඉදිරියේදී මේ ගැන කටයුතු කරන්න බලමු.

8.18 2013 මැයි මාසය සඳහා පුස්තකාල සඳහා ලබා ගත් පුවත්පත් වෙනුවෙන් රු. 36235.00 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි එම්. එස්. වීරසිංහ මහතා වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.19 වදන් සැකසුම් හා නාම පුවරු සඳහා ලබාගත් 15000.00 ක අත්තිකාරම් පියවීමට ලේකම්ගේ නිර්දේශය පරිදි සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.20 බංගලාදේශ රාජ්‍ය දූත පිරිස පැමිණීමේ දී ලබා දුන් තෑග හා සංග්‍රහ කටයුතු වෙනුවෙන් රු. 21147.00 ක මුදලක් වැය කිරීම වෙනුවෙන් ලේකම්ගේ නිර්දේශය පරිදි සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.21 2013 මැයි මාසයට නියමිත රු. 50000.00 ක VAT මුදල ලේකම්ගේ නිර්දේශය පරිදි දේශීය ආදායම් කොමසාරිස් වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.22 බංගලාදේශ රාජ්‍ය දූත නියෝජිත පිරිස වෙනුවෙන් දිවා ආහාරය සඳහා වැය වූ රු. 32400 ක මුදල වෙනුවෙන් ලේකම්ගේ නිර්දේශය පරිදි සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.23 හල්වතුර කසල අවසන් බැහැරලන ස්ථානයේ කටයුතු වෙනුවෙන් ජේ. සී. බී. යන්ත්‍රය හා ටිපර් රථ යොදා මාර්ගය සකස් කිරීම හා කසළ බැහැරලීමේ කටයුතු වෙනුවෙන් දීපිකා කන්ස්ට්‍රක්ෂන් ආයතනය වෙත රු. 80850.00 ක මුදලක් වැඩ අධිකාරී හා ලේකම්ගේ නිර්දේශය පරිදි දීපිකා කන්ස්ට්‍රක්ෂන් වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.24 අම්බලන්ගොඩ, පටබැඳිගෙදරවත්ත දෙවැට I හි පදිංචි හෙන්දහේවා සෝමාවති ද සිල්වා මහත්මිය සමෘද්ධිලාභියෙකු බැවින් ඇයගේ ආදාහනය වෙනුවෙන් අය කල මුදලින් නැවත අයදුම්කරුට රු. 2000.00 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.25 සභාපතිතුමා, උප සභාපතිතුමා ඇතුලු නගර සභා මන්ත්‍රීවරුන්ගේ 2013 අප්‍රේල් සහ මැයි මස ගමන් වියදම් වෙනුවෙන් රු. 60000.00 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.26 පළාත් නිශ්චිත 2012 සංවර්ධන සැලැස්ම යටතේ පොල්වත්ත නුගේතුඩුව මාර්ගය අවසාන කොටස හා අවසාන අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තයේ රැඳවුම් මුදල වන රු. 79257.43 ක මුදලක් වැඩ අධිකාරී හා ලේකම්ගේ නිර්දේශය පරිදි පොල්වත්ත ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.27 පළාත් නිශ්චිත 2012 සංවර්ධන සැලැස්ම යටතේ පොල්වත්ත නුගේතුඩුව මාර්ගය අවසාන කොටස හා අවසාන අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තයේ රැඳවුම් මුදල වන රු. 4874.38 ක මුදලක් වැඩ අධිකාරී හා ලේකම්ගේ නිර්දේශය පරිදි පොල්වත්ත ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.28 හිරේවත්ත නාන තොටුපොල අසල පිහිනුම් ක්‍රීඩකයන් සඳහා ඇඳුම් මාරු කිරීමේ කාමරයක් ඉදිකිරීමේ කර්මාන්තයේ කොටස් මුදල වන රු. 214089.06 ක මුදලක් වැඩ අධිකාරී හා ලේකම්ගේ නිර්දේශය පරිදි හෙප්පුමුල්ල කුඩා ගම්මාන සමිතිය වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.29 පටබැඳිමුල්ල මුහුදු වෙරළ හරස් පාර කාණු පද්ධතිය සැකසීම සහ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේ කර්මාන්තයේ (අතිරේක වැඩ) රැඳවුම් මුදල වන රු. 43584.20 ක මුදලක් වැඩ අධිකාරී හා ලේකම්ගේ නිර්දේශය පරිදි පටබැඳිමුල්ල ග්‍රාමීය සමෘද්ධි සංවර්ධන සමිතිය වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.30 ධම්මකුසල පාර කාණු කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තයේ අවසාන ගෙවීම් මුදල වන රු. 443898.43 ක මුදලක් වැඩ අධිකාරී හා ලේකම්ගේ නිර්දේශය පරිදි හෙප්පුමුල්ල කුඩා ගම්මාන සමිතිය වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.31 ලංකා විදුලි බල මණ්ඩලයේ සුභ සාධක සංගමයේ රැස්වීමක් වෙනුවෙන් ධීවර සංකීර්ණය වෙන් කිරීම් කර භාවිතයට නොගැනීම වෙනුවෙන් ගෙවිය යුතු මුදල ලේකම්ගේ නිර්දේශය පරිදි අනිල් ප්‍රියන්ත බටදූවආරච්චි මහතා වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.32 එච්. ටී. සී. එච්. ද සිල්වා මහතා 2013 අප්‍රේල් මැයි මාස තුල එකතු කරන ලද හිග වරිපනම් බදු වෙනුවෙන් ගෙවිය යුතු කොමිස් මුදල වන රු. 19693.34 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.33 පොල්වත්ත වරිපනම් අංක 233/1, 233/2 දරණ නිවාස වලට ප්‍රවේශය ලබන මාර්ගය සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ රැඳවුම් මුදල වන රු. 28202.93 ක මුදලක් වැඩ අධිකාරී හා ලේකම්ගේ නිර්දේශය පරිදි පොල්වත්ත ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.34 තල්ගස්ගොඩබැද්ද ඉඩම ක්‍රීඩා පිටියක් සඳහා සමතල කිරීමේ කර්මාන්තයේ රැඳවුම් මුදල රු. 116546.27 ක මුදලක් වැඩ අධිකාරී හා ලේකම්ගේ නිර්දේශය පරිදි පරිදි තල්ගස්ගොඩ එකමුතු ග්‍රාමීය සමෘද්ධි බලකාය වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.35 විද්‍යුත් පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීමේ කර්මාන්තයේ අවසාන ගෙවීම වන රු. 544827.01 ක මුදලක් වැඩ අධිකාරී හා ලේකම්ගේ නිර්දේශය පරිදි බටපොල බටහිර ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.36 කැටැන්තොට පෙර පාසල් භූමිය වටා ආරක්ෂිත වැට ඉදිකිරීමේ කර්මාන්තයේ අවසාන ගෙවීම් මුදල වන රු. 163669.89 ක මුදලක් වැඩ අධිකාරී හා ලේකම්ගේ නිර්දේශය පරිදි පරිදි හෙප්පුමුල්ල කුඩා ගම්මාන සමිතිය වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.37 පොල්වත්ත පෙර පාසල ප්‍රතිසංස්කරණය කිරීමේ කර්මාන්තයේ රුඳවුම් මුදල රු. 34931.20 ක මුදලක් වැඩ අධිකාරී හා ලේකම්ගේ නිර්දේශය පරිදි පරිදි බටපොල බටහිර ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.38 පෝරඹ දේවාල පාර අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තයේ රුඳවුම් මුදල රු. 45927.54 ක මුදලක් වැඩ අධිකාරී හා ලේකම්ගේ නිර්දේශය පරිදි පොල්වත්ත ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.39 තල්ගස්ගොඩ පෙර පාසලේ ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීමේ කර්මාන්තයේ රුඳවුම් මුදල රු. 35310.84 ක මුදලක් වැඩ අධිකාරී හා ලේකම්ගේ නිර්දේශය පරිදි තල්ගස්ගොඩ එකමුතු ග්‍රාමීය සමෘද්ධි බලකාය වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.40 තල්ගස්ගොඩ පෙර පාසලේ ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීමේ (අතිරේක වැඩ) කර්මාන්තයේ රුඳවුම් මුදල රු. 2592.00 ක මුදලක් වැඩ අධිකාරී හා ලේකම්ගේ නිර්දේශය පරිදි තල්ගස්ගොඩ එකමුතු ග්‍රාමීය සමෘද්ධි බලකාය වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

## (09) ගිණුම්

**9:1** 2013 මැයි මාසයේ වියදම් වාර්තාව, වියදම් වැය විශ්ලේෂණය - පොදු ගිණුම, මුදල් සාරාංශය හා ලැබීම් විග්‍රහය සභාවට ඉදිරිපත් කරන ලදී.

ඒ අනුව 2013 මැයි මස ගිණුම් වාර්තා පිළිගතයුතු බව ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතාගේ හා ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

## (10) ඇස්තමේන්තු

**10.1** හෙප්පුමුල්ල පෙර පාසල හා පුස්තකාල ගොඩනැගිල්ලේ සිවිලිං සවිකිරීම (අතිරේක වැඩ) සඳහා වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු. 562701.17/- ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☛ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.2** ඕකන්ද පෙර පාසල හා පුස්තකාල ගොඩනැගිල්ලේ සිවිලිං සවි කිරීම සඳහා වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු. 285370.25 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.3** හල්වතුර නිවාස යෝජනා ක්‍රමයේ වරිපනම් අංක 73 - 45 දක්වා නිවාස ආරම්භයේ සිට අවසානය දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරීමසඳහා වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු. 759796.02 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.4** සුදුවැල්ල පළවන හරස් පාර කොන්ක්‍රීට් කුට්ටි අතුරා සකස් කිරීම සඳහා වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු. 633347.20 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.5** තල්ගස්ගොඩ ප්‍රධාන පාරේ වරිපනම් අංක 27A අසලින් ඇති හරස් පාර කොන්ක්‍රීට් කුට්ටි අතුරා සකස් කිරීම සඳහා වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු. 500431.20 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.6** කෙරමිණිය කුකුළු ගොව්පොල පාර කොන්ක්‍රීට් අතුරා සංවර්ධනව කිරීම සඳහා වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු. 508410.60 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.7** පින්නදුව III වන හරස් පාර කොන්ක්‍රීට් කුට්ටි අතුරා සංවර්ධනය කිරීම සඳහා වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු. 500345.55 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.8** ඕකන්ද ප්‍රජාශාලාව වටා ආරක්ෂිත වැටක් ඉදි කිරීම සඳහා වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු. 367198.92 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**තීරණය**

☛ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.9** හල්වතුර නිවාස යෝජනා ක්‍රමයේ වරිපනම් අංක 73 - 45 දක්වා නිවාස ආරම්භයේ සිට අවසානය දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරීම (අතිරේක වැඩ) සඳහා වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු. 23970.00 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**තීරණය**

☛ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.10** පින්නදූව වට රවුම් පාර පළමු හරස් පාර පැති බැම්ම ඉදි කිරීම සඳහා වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු. 137126.88 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**තීරණය**

☛ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.11** මහ අම්බලන්ගොඩ නිවාස යෝජනා ක්‍රම මාවත කාණු කොන්ක්‍රීට් කිරීම සඳහා වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු. 932971.60 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**තීරණය**

☛ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.12** ප්‍රධාන පාර කාණු පද්ධතිය පතුල ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු. 997111.23 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**තීරණය**

☛ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.13** ගාළු පාර කාණු පද්ධතිය පතුල ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු. 321002.00 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**තීරණය**

☛ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.14** වික්‍රමසූරිය පාර කාණු පද්ධතිය පතුල ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු. 115251.73 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

තීරණය

☛ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.15** මහජන කීඩා පිටියේ ග්‍රීන් නෙට් ආවරණය සිදු කිරීම සඳහා වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු. 373544.49 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

තීරණය

☛ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.16** 2013 නගර ක්‍රීඩා උළෙල සඳහා වැඩ ප්‍රජා සංවර්ධන නිලධාරී විසින් සකස් කරන ලද රු. 416000.00 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

තීරණය

☛ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.17** මාදම්පා ගග දුම්රිය පොල මාර්ගයට යාබදව ඇති ගොඩබිම් තීරයේ අවන්හලක් ඉදි කිරීම සඳහා වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු. 1692740.83 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

තීරණය

☛ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.18** විදුහුත් පුස්තකාලය ඉදිකිරීම (අමතර වැඩ) සඳහා වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු. 6841.00 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

තීරණය

☛ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී**

**(11)** වෙනත් කරුණු නැත

**(12)** න්‍යාය පත්‍රයට ඇතුලත් නොවූ වෙනත් කරුණු

**12:1** **‘** සාමය සඳහා වූ නගරාධිපතිවරුන්ගේ සම්මේලනය ජපානයේ හිරෝෂිමාහි පැවැත්වෙන බැවින් එයට සහභාගිවම සඳහා නිවාඩු ඉල්ලා සිටීම **“** මැයෙන් අම්බලන්ගොඩ නගර සභාවේ ගරු උප සභාපතිතුමා විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදය මගින් සංවිධානය කල සාමය සඳහා වූ නගරාධිපතිවරුන්ගේ සම්මේලනය හිරෝෂිමාහි දී 2013 අගෝස්තු මස 2 - 7 දින දක්වා පැවැත්වෙන බවත් එයට සහභාගි වීම සඳහා 2013 අගෝස්තු මස 1 - 15 දින දක්වා නිවාඩු ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කථා කරමින්,**

සභාපතිතුමනි ගරු උප සභාපතිතුමා සහභාගි වන සංචාරය සඳහා අපි සුබ පතනවා. එතුමාට සභාවෙන් යම් දීමනාවක් ලබා දෙන්න හැකිනම් එය ලබා දෙන ලෙසත් ඉල්ලා සිටිනවා.

**තීරණය**

☛ **සාමය සඳහා වූ නගරාධිපතිවරුන්ගේ සම්මේලනය සඳහා සහභාගිවීමට 2013 අගෝස්තු මස 1 - 15 දින දක්වා නිවාඩු ලබා දීමටත් චක්‍රලේඛ අංක මු. කු. අ. 01/2010/01 හි අංක 5 අනුව දීමනා ගෙවීමටත් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:2** ' පළාත් පාලන ආයතන සඳහා කල්බදු ක්‍රමය යටතේ වාහන මිලදී ගැනීම " මැයෙන් පළාත් පාලන කොමසාරිස්තුමා විසින් එවන ලද ලිපිය සභාගත කරන ලදී.

ගරු ආණ්ඩුකාර තුමිය විසින් පළාත් පාලන ආයතන සඳහා කල් බදු ක්‍රමය යටතේ වාහන මිලදී ගැනීමට වැඩ පිළිවෙලක් සකස් කර ඇති බවත් ඩබල් කැබ් රථයක් සඳහා මාසික කල් බදු වාරිකය රු. 84545.00 වන බවත් පළාත් පාලන ආයතනයට එය ගෙවීමට හැකියාවක් පවතී නම් ඒබ ව දැනුම් දෙන ලෙසත් දන්වා තිබුණි.

**තීරණය**

☛ **ඩබල්කැබ් රථයක් සඳහා මාසික කල්බදු ක්‍රමය යටතේ බදු වාරික ගෙවීමට හැකියාව ඇති බව දන්වා යැවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:3** ' බැංකු ගාස්තු ගිණුම්ගත කිරීමට අනුමැතිය ලබා ගැනීම ප්‍රජා ආධාරක අරමුදල් ගිණුම " මැයෙන් පොත් තබන නිලධාරිණිය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන ප්‍රජා ආධාරක ගිණුම වෙනුවෙන් 2013 අප්‍රේල් මාසය සඳහා රු. 841.80 ක මුදලක් සෘජුවම බැංකු ගිණුමෙන් අයකර ඇති අතර එය ගෙවීමක් වශයෙන් ගිණුම්ගත කිරීමට අනුමැතිය ඉල්ලා තිබුණි.

**තීරණය**

☛ **ඉහත සඳහන් පරිදි රු. 841.80 ක් ගිණුම්ගත කිරීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:4** ' අම්බලන්ගොඩ බස් නැවතුම්පල ඔරලෝසු කණුව ඉදිරිපිට අතුරු මාර්ගය " මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

ඔරලෝසු කණුව ඉදිරිපිටින් අලුත්පාරේ සිට මහා විදිය සම්බන්ධ කරන අතුරු මාර්ගය සඳහා ඉඩම් අත්කර ගැනීම වෙනුවෙන් ගෙවිය යුතු වන්දි මුදල් වලින් රු. 250000.00 ක කොටස් මුදලක් ප්‍රාදේශීය ලේකම් වෙත ගෙවීම් කිරීමට අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා තිබුණි.

තීරණය

☛ **ගණකාධිකාරිගේ නිර්දේශය පරිදි ප්‍රාග්ධන ගිණුමට මුදල් මාරුකර එම ගිණුමෙන් රු. 250000.00 ක මුදලක් ඉඩම් අත්පත් කර ගැනීම වෙනුවෙන් කොටස් මුදලක් වශයෙන් ප්‍රාදේශීය ලේකම්, අම්බලන්ගොඩ වෙත ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:5** ' දෛනික දීමනාව වැඩිකර ගැනීම සඳහා ඉල්ලීම " මැයෙන් වඩු කාර්මික ඩබ්. පී. සෝමරත්න මහතා විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

දැනට ලබා දෙන දෛනික දීමනාව රු. 800/- ක් බවත් එය ජීවත් වීම සඳහා ප්‍රමාණවත් නොවන බවත් එමනිසා දීමනාව වැඩිකර දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

තීරණය

☛ **දිස්ත්‍රික් මිල නියම කිරීමේ කමිටුව පරිදි වැඩ අධිකාරිගේ හා ලේකම්ගේ නිර්දේශය පරිදි දෛනික වැටුප රු. 950/- බැගින් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:6** ' නිවාස තුනක් සඳහා ඇති මාර්ගය කොන්ක්‍රීට් කර ගැනීම සඳහා " මැයෙන් අම්බලන්ගොඩ, පොල්වත්ත කේ. පී. ගංගා අයිරානි, ටී. පී. සරත්, අනුර ප්‍රියනන්ද යන අය විසින් එවන ලද ලිපිය සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ පොල්වත්ත පාරේ වරිපනම් අංක 196A, 192/2, 192/1 දරණ නිවාස වලට යාමට ඇති මාර්ගය නගර සභාවට පවරාගෙන සංවර්ධනය කර දෙන ලෙස ඉල්ලා තිබුණි.

තීරණය

☛ **ඉහත සඳහන් අතුරු මාර්ගය නගර සභාවට පවරාගෙන සංවර්ධනය කිරීමට තීරණය කරන ලදී.**

**12:7** ' 2013 මාර්තු මස වාර්තාව " මැයෙන් අම්බලන්ගොඩ නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ වෛද්‍ය නිලධාරී විසින් ඉදිරිපත් කර තිබූ වාර්තාව සභාගත කරන ලදී.

ආයතනය විවෘතව තැබූ දින ගණන 20 බවත් පැමිණි රෝගීන් සංඛ්‍යාව 252 බවත් රෝගීන් පැමිණීමේ දෛනික සාමාන්‍ය 13 ක් බවත් මාසය සඳහා වැයවූ ඖෂධවල වටිනාකම රු. 19886.24 ක් බවත් රෝගියෙක් සඳහා වැයවූ මුදල රු. 79.00 ක් බවත් දන්වා තිබුණි.

තීරණය

☛ **මෙම වාර්තාව සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

**12:8** ' 2013 අප්‍රේල් මස වාර්තාව " මැයෙන් අම්බලන්ගොඩ නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ වෛද්‍ය නිලධාරී විසින් ඉදිරිපත් කර තිබූ වාර්තාව සභාගත කරන ලදී.

ආයතනය විවෘතව තැබූ දින ගණන 16 බවත් පැමිණි රෝගීන් සංඛ්‍යාව 200 බවත් රෝගීන් පැමිණීමේ දෛනික සාමාන්‍ය 13 ක් බවත් මාසය සඳහා වැයවූ ඖෂධවල වටිනාකම රු. 15244.00 ක් බවත් රෝගියෙක් සඳහා වැයවූ මුදල රු. 76.00 ක් බවත් දන්වා තිබුණි.

<u>තීරණය</u>

☛ **මෙම වාර්තාව සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

**12:9** ' 2013 මැයි මස වාර්තාව " මැයෙන් අම්බලන්ගොඩ නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ වෛද්‍ය නිලධාරී විසින් ඉදිරිපත් කර තිබූ වාර්තාව සභාගත කරන ලදී.

ආයතනය විවෘතව තැබූ දින ගණන 21 බවත් පැමිණි රෝගීන් සංඛ්‍යාව 295 බවත් රෝගීන් පැමිණීමේ දෛනික සාමාන්‍ය 14 ක් බවත් මාසය සඳහා වැයවූ ඖෂධවල වටිනාකම රු. 27215.72 ක් බවත් රෝගියෙක් සඳහා වැයවූ මුදල රු. 92.00 ක් බවත් දන්වා තිබුණි.

<u>තීරණය</u>

☛ **මෙම වාර්තාව සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

**12:10** ' නගර සභාව සතු කඩ කාමර තක්සේරු කිරීම " මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

නගර සභාවට අයත් නව පොදු වෙළඳපොල, පොල්වත්ත වෙළඳ සංකීර්ණය, ක්‍රීඩා මණ්ඩපයට යාබද කාමර, සතොස කඩ කාමර සහ ෆංජිපානි පෙරපාසල සඳහා නව තක්සේරුවක් කිරීමට අවසර ලබා දෙන ලෙස ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☛ **නගර සභාවට අයත් නව පොදු වෙළඳපොල, පොල්වත්ත වෙළඳ සංකීර්ණය, ක්‍රීඩා මණ්ඩපයට යාබද කාමර, සතොස කඩ කාමර සහ ෆංජිපානි පෙරපාසල සඳහා නව තක්සේරුවක් කිරීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:11** ' වරිපනම් ප්‍රතිශෝධනය කිරීමට අනුමැතිය ලබා ගැනීම " මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

මෙම කාර්යාලයේ 2004 වර්ෂයෙන් පසු වරිපනම් ප්‍රතිශෝධනයක් කර නොමැති බවත් වරිපනම් ප්‍රතිශෝධනයක් කිරීමට තක්සේරු දෙපාර්තමේන්තුව වෙත දන්වා යැවීමට අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☛ **වරිපනම් ප්‍රතිශෝධනය සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවට දන්වා යැවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:12** ' මෝදර වේවාලයේ ඇසළ මහා පෙරහර දිනවල වෙනත් උත්සව සහ සංදර්ශන පැවැත්වීමට අවසර නොදීම පිළිබඳව " මැයෙන් හිරේවත්ත මෝදර දේවාල කමිටුව විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

හිරේවත්ත මෝදර දේවාලයේ 69 වන වාර්ෂික මහා පෙරහර 2013 සැප්තැම්බර් 20 සහ 21 දෙදින පැවැත්වෙන බවත් එම දිනයන්හිදී නගර ශාලාව සහ ක්‍රීඩාංගණය වෙනත් කිසිදු උත්සවයක් හෝ සංදර්ශනයක් සඳහා ලබා නොදෙන ලෙසත් නගර සභා බල ප්‍රදේශය තුල එවැනි කාර්යක් සඳහා අනුමැතිය ලබා නොදෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **මෝදර දේවාලයේ ඇසළ මහා පෙරහර දිනවල වෙනත් උත්සව සහ සංදර්ශන පැවැත්වීමට අනුමැතිය ලබා නොදෙන ලෙසට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:13** ' ගෘහපති දානය සඳහා පුටු 300 ක් ලබා ගැනීම " මැයෙන් මහාචාර්ය විලේගොඩ අරියදේව හිමියන් විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

විහාරස්ථානයේ පැවැත්වෙන ගෘහපති දානමය පිංකමක් සඳහා ප්ලාස්ටික් පුටු 300 ක් නොමිලේ ලබා දෙන ලෙස ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **ගෘහපති දානය සඳහා පුටු 300 ක් නොමිලයේ ලබා දීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:14** ' ස්තුතිය පුද කිරීම " මැයෙන් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම්තුමිය විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

දකුණු පළාත් ආබාධ සහිත තිනිත්තන්ගේ අභාවෘද්ධිය උදෙසා 2013- 06- 21 දින ධීවර සංකීර්ණ ශාලාවේදී පැවැත්වූ ප්‍රසංගය සාර්ථකව නිම කල බවත් ඒස දහා නන් අයුරින් දැක්වූ සහයෝගයට ස්තුතිය පුද කරන බවත් දන්වා තිබුණි.

<u>තීරණය</u>

☞ **මෙම ලිපිය සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

**12:15** ' මාර්ග සංවර්ධන කටයුතු සඳහා මිල ගණන් " ගාල්ල, දිස්ත්‍රික් ඉංජිනේරුතුමා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

2013 – 2 වන භාගයේ දිස්ත්‍රික් මිල නියම කිරීමේ කමිටුව විසින් නියම කරන ලද මිල ගණන් ඉදිරිපත් කර තිබුණි.

<u>තීරණය</u>

☞ **මෙම ලිපිය සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

**12:16** ‘ වෙරළ උද්‍යානයේ ආරක්‍ෂාව සුරැකීම සඳහා ‟ මැයෙන් ප්‍රජා සංවර්ධන නිලධාරිතුමිය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

නගර සභාව සතු භූමියක් වන වෙරළ උද්‍යානය මේ වන විට නොයෙකුත් අකටයුතුකම් සිදුවන ස්ථානයක් බවට පත්වී ඇති බවත් මෙහි ආරක්‍ෂාව සහ නගර සභාවට ආදායමක් ලබා ගැනීම සඳහා ආපන ශාලාවක් ඉදිකර පවත්වාගෙන යාම සුදුසු බවත් ඒ සඳහා අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☛ **වෙරළ උද්‍යානයේ ආරක්‍ෂාව හා අලංකාරය වර්ධනය සඳහා ආපන ශාලාවක් පවත්වාගෙන යාමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:17** ‘ **LF- 1853** ටිපර් රථය අලුත්වැඩියා කිරීම ‟ මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

**LF- 1853** ටිපර් රථය අලුත්වැඩියා කිරීම සඳහා රු. 20000/- ක අත්තිකාරම් මුදලක් ලබා ගත් බවත් එය පියවීම සිදු කල බවත් දන්වා තිබුණි.

<u>තීරණය</u>

☛ **රු. 20000/- ක අත්තිකාරම් මුදල පියවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

- **ප. ව. 12.00 ට පමණ ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා සභා ගර්භයෙන් ඉවත්ව ගිය බැවින් ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා මුලාසනයේ අසුන් ගන්නා ලදී.**

**12:18** ‘ ජාතික මදුරු මර්දන සතිය - 2013 ජුලි 1- 7 දක්වා ‟ මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

නගර සභාව මගින් බල ප්‍රදේශය තුල ජනතාව දැනුවත් කිරීම සිදු කරන බවත් මදුරුවන් බෝවීම පිළිබඳව අවධානම් ප්‍රදේශවල ධූමායන කටයුතු සිදු කරන බවත් නගර සභා බල ප්‍රදේශය තුල සමීක්‍ෂණ කටයුතු සිදු කිරීම වැනි කටුයුතු සිදු කරනු ලබන බවත් ඒ සඳහා වන රු. 90000/- ක ඇස්තමේන්තුව සඳහාද අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කථා කරමින්,</u>**

පසුගිය දින පවත්වන ලද ඒ වැඩසටහන ඉතා උසස් මට්ටමක පැවතුනා. අයහපත් කාලගුණ තත්වය නිසා යම් අඩාල වීමක් තිබුනත් නිලධාරින්ගෙ කැපකිරීම අගය කරන්න ඕනෙ. අපි ලේකම්තුමා ප්‍රමුඛ කාර්ය මණ්ඩලයට ස්තුතිවන්ත වෙනවා.

<u>තීරණය</u>

☛ **ජාතික මදුරු මර්ධන සතිය වෙනුවෙන් 2013 ජුලි 01 - 07 දක්වා ක්‍රියාත්මක කරනු ලබන ඉහත වැඩ සටහන සඳහා නියමිත රු. 90000/- ක ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

- **ප. ව. 12.10 ට පමණ ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා මූලාසනයේ අසුන් ගන්නා ලදී.**

**12:19** ' භාණ්ඩාගාර බිල්පත්වල මුදල් ආයෝජනය ' මැයෙන් පොත් තබන නිලධාරී විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

භාණ්ඩාගාර බිල්පත්වල මුදල් ආයෝජනය කිරීමේදී වැඩිම මිළ ගණන් සදහන් කර ඇති Entrust Securities හි ආයෝජනය කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා තිබුණි.

<u>**ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කථා කරමින්,**</u>

සභාපතිතුමනි රජයේ බැංකුවක මාස තුනෙන් තුනට ස්ථාවර තැන්පතු දාන එක වඩා ලාභදායී වෙනවා. භාණ්ඩාගාර බිල්පත් වලට වඩා.

<u>තීරණය</u>

☞ **වර්තමාන බැංකු ක්‍රමය තුල පවතින පොලියත් සමග සසදා බලා වැඩි ලාභදායීත්වයක් පවතින ආයතනයක තැන්පත් කිරීමට සභාව තීරණය කරන ලදී.**

**12:20** ' කාය වර්ධන උපකරණ වලින් යුත් ස්ථානයක් ස්ථාපිත කිරීම ' මැයෙන් අම්බලන්ගොඩ චෝකින් ක්ලබ් හි ලේකම් මහතා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

සංගමයේ සාමාජිකයන් හට කාය වර්ධන මධ්‍යස්ථානයක් ඇති කිරීමට අවශ්‍ය බවත් ඒ සඳහා උපකරණ සපයා ගත හැකි බවත් ඒ සඳහා සුදුසු ස්ථානයක් අවශ්‍ය බැවින් ඒ සඳහා නගර සභා ක්‍රීඩාංගණයේ ක්‍රීඩාගාරයේ කාමරයක් ලබා දීමට කටයුතු කරන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **නගර සභා ක්‍රීඩාංගණයේ ක්‍රීඩාගාරයේ කායවර්ධන ස්ථානයක් පිහිටුවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:21** ' පොසොන් බැති ගී තරගාවලිය ' මැයෙන් ප්‍රජා සංවර්ධන නිලධාරී මිය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සංවිධානය කරන ලද පොසොන් බැති ගී තරගාවලියට නගර සභා කණ්ඩායමක් සහභාගි වූ බවත් ඔවුන් දෙවන ස්ථානය දිනාගත් බවත් දන්වා තිබුණි.

<u>තීරණය</u>

☞ **මෙම ලිපිය සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

**12:22** ' නිවාස වලට පිවිසෙන මාර්ගය කොන්ක්‍රීට් අතුරා සකස් කරගැනීම ' මැයෙන් කුලරත්න පාර වරිපනම් අංක 51, 51A, 51/1, 51/2, 51/3 දරණ නිවැසියන් වන නලින් තරින්ද මයා වෙනුවට එම භාර්යාව, කේ. ඒ. එල්. එස්. ජයසේකර මයා, කිසලයින් ඉන්දුදේව ගිණිගේ මයා, එස්. තිලකරත්න මයා යන අය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

අංක 83 කරිත්තකන්ද ග්‍රාමසේවා වසමට අයත් වරිපනම් අංක 51, 51A, 51/1, 51/2, 51/3 දරණ නිවාස පහ සඳහා පිවිසෙන මාර්ගය නගර සභාවට පවරාගෙන සංවර්ධනය කර දෙන ලෙස ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☛ **කුලරත්න පාරේ සිට වරිපනම් අංක 51 – 51/3 දක්වා වූ නිවාස වලට ප්‍රවේශය ලබන මාර්ගය සංවර්ධනය කිරීම (සක්වා ප්‍රින්ටර්ස් අසලින් යන පාර) සභාවට පවරාගෙන සංවර්ධනය කිරීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:23** ' මන්ත්‍රී යෝජනාව ඉල්ලීම ' මැයෙන් ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

තමා ජූලි මාසය ඇතුලතදී විදේශගත වීමට බලාපොරොත්තු වන බවත් ඒ සඳහා අවසරය ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☛ **2013 ජූලි මාසයේදී විදෙස්ගත වීමට සභාවේ අවසරය ලබා දෙන ලදී.**

**12:24** ' **e- Library** ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය භෞතික සම්පත් ලබා ගැනීම ' මැයෙන් ප්‍රජා සංවර්ධන නිලධාරී මිය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

ප්‍රධාන පුස්තකාලයේ ආරම්භ කිරීමට යෝජිත **e- Library** සඳහා අවශ්‍ය මොනිටර් 11 කින් යුත් ජාල ගත කරන ලද පරිගණක පද්ධතියේ, පරිගණක මේස 10 ක්, පරිගණක පුටු 11 ක්, ලියන මේස 01 ක්, මුද්‍රණ යන්ත්‍ර 01 ක්, ෆැක්ස් යන්ත්‍ර 01 ක්, දුරකථන යන්ත්‍ර 01 ක්, කබඩ් 01 ක්, ඡායා පිටපත් යන්ත්‍ර 01 ක් සහ ස්කැනර් යන්ත්‍ර 01 ක් ලබා දීමට කටයුතු කරන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☛ **විද්‍යුත් පුස්තකාලය සඳහා අවශ්‍ය භෞතික සම්පත් ලබා දීමට සභාවේ අවසරය ලබා දෙන ලදී.**

**12:25** ' බැඩ්මින්ටන් ක්‍රීඩාගාරය ලබා ගැනීම ' මැයෙන් බූස්ස රෙජිමේන්තු පුහුණු පාසලේ ප්‍රධාන උපදේශක මේජර් විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

ශ්‍රී ලංකා පාබල හමුදාවට අයත් රණවිරුවන් තුන් දෙනෙකු සඳහා බැඩ්මින්ටන් ක්‍රීඩා පුහුණුවීම් සිදු කිරීම සඳහා බැඩ්මින්ටන් ක්‍රීඩාගාරය සතියේ දිනවල පෙ. ව. 9.00 සිට පෙ. ව. 11.00 දක්වා මාස දෙකක කාලයක් සඳහා මුදල් අය කිරීමකින් තොරව ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

තීරණය

☛ **මාස දෙකක කාලයක් සඳහා බුස්ස යුධ හමුදා කඳවුර රෙජිමේන්තු පුහුණු පාසල වෙත සතියේ දිනවල පෙ. ව. 9.00 සිට පෙ. ව. 11.00 දක්වා කාලය තුල පුහුණුවීම් සඳහා විදුලි ගාස්තු අය කර නොමිලේ ලබා දීමට ලබා දීමට සභාව තීරණය කරන ලදී.**

**12:26** ' පරීක්ෂණ ගාස්තු සංශෝධනය " මැයෙන් දකුණු පළාත් පළාත් පාලන කොමසාරිස්තුමා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

ඉහළ ගිය විදුලි ගාස්තු හා අනෙකුත් සාධක පදනම් කරගෙන පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ගාල්ල හා මාතර ඉදිකිරීම් ද්‍රව්‍ය පරීක්ෂණාගාරයන්හි පරීක්ෂණ ගාස්තු සංශෝධනයකට ලක් කිරීම ව්‍යාපෘති පාලන මණ්ඩලය විසින් අනුමත කර ඇති බවත් ඒ අනුව 2013- 07- 01 දින සිට සංශෝධිත ගාස්තු අය කරන බවත් දන්වා තිබුණි.

තීරණය

☛ **මෙම ලිපිය සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

**12:27** ' රට වෙනුවෙන් දිවි පිදූ රණවිරුවාගේ සොහොන් කොත බැඳ ගැනීමට අම්බලන්ගොඩ නගර සභාව අවසර නොදීම සම්බන්ධවයි " මැයෙන් කෙරමිණිය අංක 323 හි අයි. පී. එම්. ගයානි බණ්ඩාර මහත්මිය විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

තමාගේ ස්වාමි පුරුෂයා 2009- 01- 09 දින කුරිරු ත්‍රස්තවාදී ප්‍රහාරයකින් මරණයට පත්වූ බවත් ඔහුගේ දේහය පොල්වත්ත සුසාන භූමියේ භූමදානය කල බවත් එම ස්ථානයේ සොහොන් කොතක් බැඳ ගැනීමට මීට පෙරද නගර සභාවෙන් අවසර ඉල්ලා සිටි නමුත් ඒ සඳහා අවසර නොලැබුන බවත් මේ සඳහා අතිගරු ජනාධිපතිතුමාගේ සහ ගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ අවසරය ලැබී ඇති බවත් ඒ සඳහා නගර සභාවේ අවසරය ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

**ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදිප් මහතා කථා කරමින්,**

මේ සම්බන්ධයෙන් ජනාධිපති කාර්යාලයෙනුත් අගමැති කාර්යාලයෙනුත් අපට ලියුම් එව්වා. අපි ඒවට නිසි පිළිතුරු යවල තියෙනවා. 1936 දෙසැම්බර් 11 වෙනිද ගැසට් පත්‍රය මගින් සෞඛ්‍ය ඇමතිවරයා විසින් පල කරල තියෙනවා. ඒ යටතේ සභාව අනුනීතියක් පනවල තියෙනවා සොහොන් කොත් බැඳීම සඳහා අවසර ලබා නොදීමට. අඩි 5 ක් සහ අඩි 3 කට නොඅඩු වලක් හදල වැලලීම සහ භූමදාන කරන ලද අලු අඩි 3 ක ගැඹුර වලක් කපා තැන්පත් කිරීම තමයි අවසර තිබෙන්නෙ. මේ නිති රීති වලට අනුව තමයි අපට වැඩ කරන්න වෙන්නෙ. මම මේක දන්වල තියෙනව අතිගරු ජනාධිපතිතුමාටත් ගරු අග්‍රාමාත්‍යතුමාටත්. මේකට ඉඩ දෙනවනම් ඒ ගැසට් එක අහෝසි කරන්න මේ සභාවෙන් තින්දුවක් ගන්න ඕනෙ. ඇත්තටම වෙනත් සභාවල් වලට ප්‍රශ්නයක් වෙලා තියෙනව මේ සොහොන් කොත් බැඳීම නිසා ඉඩ නැති වෙලා තියෙනවා. අපිට මේ ඉල්ලීම ඉටු කරන්න නම් ගැසට් එක අහෝසි කරන්න වෙනවා සභාවේ යෝජනා ස්ථිරත්වයක් අරන්. සභාවේ කැමැත්ත අනුව මම අවශ්‍ය කටයුතු කරන්නම්.

**ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්නියගේ මහතා කථා කරමින්,**

සභාපතිතුමනි මේ රණවිරුවා ක්‍රියාන්විතයේ යෙදී සිටියදී තමයි දැයට අහිමි වුනේ. මේ රණවිරුවන්ගේ සේවාව පිළිබඳව මේ සභාව කිසිදු අවතක්සේරුවක් කරන්නෙ නැහැ. නමුත් පවතින මේ නීතිරීති අනුව ඔබතුමත් මේ ගරු සභාවත් අසීරු තත්වයකට පත්ව සිටිවවා. මීට වසරකට පමණ පෙර පනහ පාර රණවිරු මේජර් උෂාන් සත්‍යජිත් මාවත ලෙස නම් කිරීමට යෝජනා කරා. ඒ යෝජනාවත් හිරවෙලා තියෙනවා. සභාපතිතුමනි සුලු හරි ඉඩක් තිබෙනව නම් ඉදිරියේදී අවශ්‍ය කටයුතු කරන්නයි කියල ඉල්ලා සිටිනවා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කථා කරමින්,**

සභාපතිතුමනි අපේ සභාවේ නිත්‍යානුකුල තත්වය මත මෙය කිරීමට අපහසු බව මේ තැනැත්තියට දන්වල යැව්ව නම් මෙතරම් ගැටලුවකට මුහුණ දෙන්න වෙන්නෙ නැහැ. මේ මහත්මියට චුට් දුවක් ඉන්නවා. සභාපතිතුමනි මේ සම්බන්ධව අවධානය යොමු කරල එතුමිය දැනුවත් කිරීමක් කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කථා කරමින්,**

සභාපතිතුමනි මේ අවස්ථාවේදී දැනගත් කරුණු අනුවත් අපේ සහෝදර ග්‍රේෂන් මන්ත්‍රීතුමා ප්‍රකාශ කල ආකාරයෙනුත් අපි රණ විරුවන් වෙනුවෙන් කෙදිනකවත් කිසිදු අව තක්සේරුවක් කරල නැහැ. මෙහිදී අපේ ගරු සභාව යම් අපහසුතාවයකට පත් වුන ආකාරයක් පෙනී යනව සභාපතිතුමනි. මෙය ජනාධිපති ලේකම් කාර්යාලය තුලටත් ගිහිල්ල තියෙනවා. අපි මේ සභාව තුලින් අම්බලන්ගොඩ ප්‍රදේශයේ සියලු රණ විරුවන් වෙනුවෙන් යම් දෙයක් කිරීමට බලාපොරොත්තු වෙනව නම් ඒ පිළිබඳව මේ සහෝදරියට දැනුම් දීල අපේ තියෙන නීති රාමුව පැහැදිලි කරොත් හොඳයි කියල මම හිතනවා. මේ සම්බන්ධව දිගින් දිගටම යනකොට අපේ සභාවත් පාලන අධිකාරියත් අපහසුතාවට පත් වෙනවා. අපේ නගරයේ මේ වනතෙක් දිවි පිදූ සියලු රණ විරුවන් වෙනුවෙන් යම් ස්මාරකයක් සකස් කිරීමට හැකි නම් වඩා යෝග්‍ය යැයි මා සිතනවා.

**ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,**

සභාපතිතුමනි මේ සම්බන්ධයෙන් අපි දැඩි ප්‍රශ්නෙකට මුහුණ පාල තියෙනවා. මේක පූර්වාදර්ශයක් නොවන ආකාරයෙන් පොඩි ගලක වගේ ක්‍රමවේදයකට යන්න පුලුවන්නම් හොඳයි. නීතියට අනුව නම් මේක කරන්න අමාරුයි. යම් දෙයක් කිරීමට හැකිනම් ඒ ගැන සලකා බලා කටයුතු කරන්න කියල මම ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**

මම මන්ත්‍රීවරුන්ට කියන්න ඕනෙ නීතිය අනුව මම බැඳල තියෙන්නෙ. මන්ත්‍රීවරුන්ට ඕන නම් මේ ගැසට් එක අද අවලංගු කරන්න පුලුවන්.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කථා කරමින්,**

සභාපතිතුමනි අපට මේ තැනැත්තිය ලිපියක් එවල තියෙනවා. මම හිතන්නෙ රටේ පවතින රීතියක් තියෙනව නම් අපි එයට ගරු කල යුතුයි. මම යෝජනා කරනවා අම්බලන්ගොඩ නගර සභා සීමාව තුල මියගිය සියලු රණවිරුවන් වෙනුවෙන් ස්මාරකයක් සෑදීම සුදුසුයි කියල. එතකොට එතුමියට මෙන්ම සියලුම දෙනාට සහනයක් වේවි.

**ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා කථා කරමින්,**

සභාපතිතුමනි උෂාන් සත්‍යජිත් රණවිරුවා මේ රටට දැයට විශාල සේවයක් කල රණවිරුවෙක්. සභාවක් විදියට අපි නීති රීති වලට යටත් වෙලා ඉන්නෙ. ලක්ෂමි මන්ත්‍රීතුමිය පැවසූ ආකාරයට අපට යම් හැකියාවක් තියෙනව නම් රණවිරු ස්මාරකයක් මේ නගරයේ ඉදි කරන්න එය ඔවුන්ට කරන විශාල ගෞරවයක්. ප්‍රධාන නගරවල් සියල්ලගේම වාගේ

මෙවැනි ස්මාරක තියෙනවා. එනිසා යම් ගෞරවයක් තියෙනව නම් සභාපතිතුමනි මේ අම්බලන්ගොඩින් බිහිවෙලා මේ රටට සේවයක් කරපු සියලු රණවිරුවන්ට ගෞරවයක් විදියට මේ කාර්ය කිරීමට හැකි වෙනවා නම් අප සියලු දෙනාටමත් ඒක ගෞරවයක් වෙනවා. ඒ සඳහා අපි විපක්ෂය වශයෙනුත් සියලු සහයෝගය ලබා දෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කථා කරමින්,</u>

සභාපතිතුමනි මේ ප්‍රශ්නෙදි නීතිමය තත්වය උඩ අපිට මේක කරන්න කියල බල කරන්න බැහැ. නමුත් මේ සභාවෙ සාකච්ඡා වුන විදියට ස්මාරකයක් ඉදි කිරීමක් කරන්න පුලුවන් නම් වඩා යෝග්‍යය වෙනවා. ඒ මහත්මියගෙ ඉල්ලීම තියෙන්නෙ තමන්ගෙ දරුවට තාත්ත පිළිබඳව පෙන්නන්න දෙයක් තියෙන්න ඕනෙ කියන එකයි. අපේ ආදාහනාගාර දෙකක් තියෙනවා. ඒ තැන්වල මෙය හදන්න පුලුවන්. මෙය ගලක කොටල නිර්මාණය කරහම පරම්පරා ගණනකටම බලන්න පුලුවන්. ඇගේ පැත්තෙන් සාධාරණ ඉල්ලීමක් වුනත් අපි පාලනය කරන අය වශයෙන් නීතිය අනුව ඇයගේ ඉල්ලීම ඉටු කරන්න බැහැ. ඒ නිසා වඩා හොඳ විදියකට ස්මාරකයේ කටයුත්ත කිරීමට කටයුතු කරන්න කියල මම ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා කථා කරමින්,</u>

සභාපතිතුමනි අපේ රටේ වසර තිහක් තිබුන යුද්ධය නිමා කරන්නට මේ රණවිරුවන් කෙසේද දායක වුනේ කියන එක මේ සියලුම මන්ත්‍රීවරුන් අවබෝධ කරගෙන ඉන්නෙ. ඒ සියල්ලම මමත් අනුමත කරනවා. 1936 අනු නීතියක් පනවල තියෙනව අපේ නගර සභාව. අපට පේනව අපේ නගරයට දෙපැත්තෙ තියෙන නගර වල තියෙන අශෝභන කමත් අපේ තිබෙන පිරිසිදු කමත් ගැන හොඳට පේනව. ගාල්ල බැලුවොත් තව අවුරුදු 10 ක් යනකොට තවත් සුසාන භූමියක් හදන්න වෙනවා. අපේ නගරයේ බුද්ධිමතුන් සිටින නගරයක්. එදා අරගෙන තියෙන්නෙ බුද්ධිමත් තීරණයක්. මමනම් මේක වෙනස් කරන්න කැමති නැහැ. මේ තීරණ මත තමයි අනාගතය පවතින්නෙ. ඒ රණවිරුවාගේ බිරිඳ මේක දැනගෙන හිටියෙ නැහැ. එහා පැත්තෙ වෙන්නෙ මොකක්ද මෙහා පැත්තෙ වෙන්නෙ මොකක්ද කියන එක තමයි තර්කෙ. අපි ඒක ගැන එතුමියට පෙන්වා දෙමු. ඒවගේම අපේ මන්ත්‍රීවරුන් හොඳ යෝජනාවක් ගෙනාව. වඩා නිවැරදි තොරතුරු ඇතුලත් කරල ස්මාරකයක් හදල ඒකට අපට වාර්ෂිකව උපහාර දක්වන්න පුලුවන් මට්ටමට පත් කරනව නම් ඒක බුද්ධිමත් තීරණයක්. මේ තැනැත්තියට මේකෙ නීතිමය තත්වය පෙන්නල දීල කටයුතු කරන්න කියල මම ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කථා කරමින්,</u>

සභාපතිතුමනි මේ රණවිරු බිරිඳ කරන ඉල්ලීම අනුව ඒ අය තමයි රට බේරගන්න බිල්ලට දුන්නෙ. අපිටත් නීතිමය තත්වයක් තියෙනවා. ඒ අනු නීති අනුව පොල්වත්ත සහ පටබැඳිමුල්ල සුසානභූමි වල හැර අම්බලන්ගොඩ නගරය තුල ආදාහන හෝ භූමදාන කිරීම තහනම් කියලත් පැහැදිලිවම ඒකෙ තියනවා. මම හිතනවා මේ මහත්මිය ඒ සම්බන්ධව නොදැන තමයි මේක යොමු කරන්න ඇත්තෙ. මීට කලින් අපේ කාලෙදි ඉල්ලීම් කිහිපයක් ආව. අපි ඒඅ යට කරුණු පැහැදිලි කරල ඒව නැවැත්තුව. මම හිතනව සභාපතිතුමනි මෙතුමාට කරන උපහාරයක් වශයෙන් පතහ පාර මේ නමින් නම් කරන ගමන්ම එතන පාර නම් කරන තැන සිමෙන්තියෙන් හදල පින්තූරයකුත් දාල ඒ විදියට හදන්න කියමු.

<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>

මේ රණවිරුවා ඒ මහත්මියගේ ස්වාමිපුරුෂයා වෙන්න කලිනුයි මට සහෝරයෙක් වුනේ. ඒ අවමංගල්‍යය වෙලාවෙ මම එක දවසින් පතහ පාර තාර දාල දුන්නා. මෙම මගේ යුතුකම ඉටු කරල තියෙනවා. මට නීතිමය රාමුව තුල කරන්න බැරි දෙයක් කරන්න බැහැ. මම විතරක් නෙමෙයි මේ පුටුවෙ වාඩි වෙන ඕනම කෙනෙක් නීතියට අනුව මේක පාලනය කරන්න ඕනෙ. ඒක මේ අය තේරුම් ගන්න ඕනෙ. අපි පොදු ස්මාරකයක් ගෞරවනීය විදියට ඉදි කරමු.

**තීරණය**

☛ **අයි. පී. එම්. ගයානි බණ්ඩාර මහත්මිය විසින් එවා ඇති ලිපිය පිළිබඳව සලකා බැලූ සභාව අම්බලන්ගොඩ නගර සභාව සොහොන් කොත් ඉදිකිරීම පිළිබඳව කටයුතු කරන නිත්‍යානුකූල තත්වය පිළිබඳව අදාල සියලු පාර්ශවයන් දැනුවත් කිරීමටත්, එම ලිපියේ පිටපතක් ගයානි බණ්ඩාර මහත්මියටද යැවීමටත්, සභාව තීරණය කරන ලදී.**

- **ප. ව. 12.55 ට සභාව කාරක සභා අවස්ථාවක් බවට පත් කරන ලදී.**
- **ප. ව. 01.00 ට කාරක සභා අවස්ථාව අවසන් කරන ලදී.**

**12:28** අම්බලන්ගොඩ කෙරමිණිය විමල්පාය හි ගර්වින් ජයරත්න මහතා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

1988 වසරේදී අම්බල්නගොඩ කෙරමිණිය දූවවත්ත පාරේ අඹගහවෙල ඉඩමෙන් පර්චස් 30 ක ප්‍රමාණයක් කලුගලගේ පීටර් සිල්වා මහතා ඇතුලු දරුවන් විසින් පුස්තකාල ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා පරිත්‍යාග බල බවත් එම ඉඩම් පරිත්‍යාගය මේ දක්වා කිසිම ඇගයීමකට ලක් නොවූ බවත් මේ සඳහා බුද්ධිමත් තීරණයක් ගෙන සාධාරණ විසඳුමක් ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

**තීරණය**

☛ **කළුගලගේ පීටර් සිල්වා මහතා සහ එම දරුවන් විසින් පරිත්‍යාග කරන ලද ඉඩමේ පරිත්‍යාග කිරීම පිළිබඳව නම් සඳහන් කොට නාම පුවරුවක් සවි කිරීමට සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී අනුර කිත්සිරි හික්කඩුව ලියනගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

✪ වෙනත් කරුණු

**ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා කථා කරමින්,**

සභාපතිතුමනි පින්නදූව III හරස් පාර සභාවට පවරාගෙන සංවර්ධනය කිරීමට ඉල්ලීමක් කරල තියෙනවා ඉන්ද්‍රානි මංගලිකා මහත්මිය, මදුෂානි රණසිංහ මහත්මිය, කුලසූරිය මහත්මා ආදි වශයෙන් හය දෙනෙකු විසින් ඉල්ලා තිබෙනවා.

**තීරණය**

මෙම පාර සභාවට පවරාගෙන සංවර්ධනය කිරීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

**ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,**

සභාපතිතුමනි පොල්වත්තපුර ඔප්පු ලබා දෙන එක කොහොමද දන්නැ. කලින් දීපු එකෙත් කීපයක් යවල නෑ. ඒකත් බලන්න ඕනෙ. ඒවගේම සභාපතිතුමා අපේ ඩීසල් ත්‍රිවිල් එක වැඩ කරන්නෙ නැද්ද. අපි කම්ප්‍රෙෂර් එකකුත් ගෙනල්ල දුන්නා. ඒවගේම යාඩ් එකත් ටිකත් හොඳට හදන්න. ඒව අපි රැකගන්න ඕනෙ.

**තීරණය**

දැනට සභාවේ භාවිතා වන කම්ප්‍රෙෂර් එක ප්‍රමාණවත් නොවන බැවින් ඊට වඩා ප්‍රමාණවත් කම්ප්‍රෙශර් එකක් ලබා ගැනීමට තීරණය විය.

**ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා කථා කරමින්,**

සභාපතිතුමනි රණසූරිය පාර බුද්ධදත්ත මාවතට වැටෙන අතුරු පාරෙ බැවුම සහිත කොටස සම්පූර්ණ ගල් ගැලවිලා. එතන වතුර පාරක් යනවා. එතන ගල් දාල හරියන්නෑ. කොන්ක්‍රීට් කරන්න ඕනෙ.

**ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කථා කරමින්,**

සභාපතිතුමනි කන්දෙ ප්‍රජාශාලව හදන්න ළිඳ ගාව ඉඩම යෝජනා කරල ඇස්තමේන්තු හදල තියෙන්නෙ. පුද්ගලික කෙනෙක් ඒ ඉඩම සුද්ධ කරල. ඒකෙ ජලැන සහ සියලු දේ මම සතුව තියෙනවා. අපේ ප්‍රමාණය වෙන් කරල ගහන්න. සියලුම ගම් වාසීන් ප්‍රජාශාලව ඉල්ලනව.

**තීරණය**

ඉහත කර්මාන්තයේ වැඩ ආරම්භ කිරීමට සභාවේ අවසරය ලබා දෙන ලදී.

**ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කථා කරමින්,**

සභාපතිතුමනි ඒවගේම මේ යාඩ් එකයි ටොයිලට් එකයි හදන්න පටන් ගන්න. ඉස්සෙල්ල කණු ටික දාන්න. ඊට පස්සෙ කොන්ක්‍රීට් එක දාමු. ලොකු ඇස්තමේන්තු හදල ඕක කෙරෙන්නෙ නෑ. සභාවෙන් කරන්න හෙටම පටන් ගන්න. ලබන සභාවට කරපු ක්‍රියාකාරිත්වය පෙන්නන්න. තවත් විශාල ප්‍රශ්නයක් තියෙව ලයිට් වතුර ගන්න ගියහම වරිපනම් අංකය ඉල්ලනව. සමහර අය අනවසර. අපේ නිලධාරීන්ට බලයක් නැද්ද මේ අයට තාවකාලිකව දෙන්න.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**

වරිපනම් තක්සේරුවක් එනව ලගදි. එතකොට අංක ලැබෙනව.

**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කථා කරමින්,**

සභාපතිතුමනි ස්වයංරැකියා පිළිබඳ කමිටුවේ තත්වය මොකක්ද.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**

කමිටුව නැවත කැඳවන්න.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කථා කරමින්,**

සභාපතිතුමනි මේ සෞඛ්‍ය අංශෙ ඉන්නව වැඩ කරන්නෙ නැති එක නිලධාරියෙක්. ඒ අයට දඬුවමක් දෙන්න. මෙයා උදේට ඇවිල්ල අත්සන් කරල ගෙදර යනව.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**

මම ඒ සේවකයට කියල තියෙන්නෙ හරියට රාජකාරි නොකරොත් එයාගෙ නියම තනතුරට දානව කියලා.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා කථා කරමින්,**

සභාපතිතුමා පනියන්දූව පාරෙ කුණු අදින දවස් දෙකෙන් හැමදාම එක දවසයි එන්නෙ. අදත් ඒ රියදුරා ගලියට දාල.

**ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේවි රොහාන් ද සිල්වා මහතා කථා කරමින්,**

සභාපතිතුමනි අප්‍රේල් මාසයේ තිබුන රැස්වීමේදි පෝරඹ වලව්ව පාරෙ බෝක්කුව සම්බන්ධයෙන් මා අදහසක් පල කරා. මේකට ඇස්තමේන්තුවක් හදන්නත් කිව්වා. නමුත් තාම ඒ කාරණය එතනමයි. ඒවගේම සභාපතිතුමනි පටබැඳිමුල්ලෙ මුහුදු වෙරළෙ කාණුව ඉතාම දුර්ගන්ධයි.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**

ඒ කාණුව අපි හදමු.

**ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේවි රොහාන් ද සිල්වා මහතා කථා කරමින්,**

සභාපතිතුමනි ඒවගේම පොදු වෙළඳපොල අසල හදන්න කොරි ඩස්ට් ටික ගෙනල්ල දෙන්න. ඒවගේම ධීවර වරායෙ කමිටුවට මම සහභාගි වුනා. එතන කුණු සතියකට දෙවරක්වත් ගන්න කියල යෝජනා වුනා.

- **ප. ව. 01.30 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදී.**

ඩී. වී. සුනිල්,
ලේකම්,
අම්බලන්ගොඩ නගර සභාව.

එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප්,
සභාපති,
අම්බලන්ගොඩ නගර සභාව.

**2013 – 06 – 25 දින,**
**අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේදීය.**